# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,923 — 1970 සැප්තැම්බර් 11 වැනි සිකුරාද — 1970.9.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)


## IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 619 | ආදායම හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| කතතුරු—ඇබෑර්තු ... — ... | 622 | අය-වැය ලේඛන ... ... ... | 633 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 626 | මාර්ග කොමිටි දන්වීම ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දන්වීම ... | — | විවිධ දන්වීම ... ... ... ... | 636 |



සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සගිකයන්ගේ සහ උපදේශකවරුන්ගේ නාම ලේඛනයක් පළවේ.

## පළාත් පාලන නිවේදන

ඇල්.ජී—ඩී 69/41

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 (2) වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් සම්පාදිත ආඥාවයි.

ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
සවදේශ කටයුතු ඇමති.

1970 අගෝස්තු 26 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණිය ගම්සභාවේ පරිපාලක සීමා ඇතුලත වූ ප්‍රදේශය, ගම්සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියට අදාල (3) තුන්වැනි අතුරු විධානයේ සඳහන් අක්කර බද්ද පණවා අයකිරීම සඳහා විශේෂ ප්‍රදේශයක් වශයෙන් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

9–328—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

ඇල්.ජී—බී. 73/48

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර, එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැන.

1970. 8. 28 වැනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථාව

### කැළි කසළ ඉවත් කිරීම පිළිබඳ ගාස්තු

1. (1) වැල්ලවාය ගම් සභාව විසින් සම්මත කර ගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 6 වැනි කාණ්ඩයේ 11 වැනි අතුරු ව්‍යවස්ථාවෙහි වූ කාරණ සඳහා ගම් සභාවට ගෙවිය යුතු කැළි කසළ ඉවත් කිරීමේ වාසික ගාස්තුව එක් එක් බාල්දිය සඳහා රුපියල් එකක් (රු. 1ක්) බැගින් විය යුතුය.

9–519—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම පිළිබඳ

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ඇල්. ජී.—බී. 74/39

## ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 (2) වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් පනවන ලද ආඥාව.

ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමති.

1970 අගෝස්තු මස 27 දින,
කොළඹදී ය.

### ආඥාව

1969 මැයි මස 30 වැනි දින අංක 14,856 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද පරිදි මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කතරගම නමින් අළුත් ගම්සභාවක් ඇති කිරීම හා බුත්තල ගම් ප්‍රදේශය වෙනස් කිරීම ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය කරුණු සඳහා මෙහිවූ උපලේඛනයේ දක්වා ඇති පරිද්දෙන් මෙයින් විධිවිධාන සලස්වනු ලැබේ.

### උපලේඛනය

1. එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව ඒ අළුත් ගම්සභාවට අදාළ විය හැකි පරිදි ගම් සභා ආඥාපනතේ සියලුම කාර්යයන් සඳහා පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ අනුප්‍රාප්තිකයා විය යුතුය.

2. පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව 1969 දෙසැම්බර් 31 වැනි දිනට වලංගුව පැවති සියලුම අතුරු ව්‍යවස්ථා එකී අළුත් ගම් ප්‍රදේශයට අදාළ ප්‍රමාණයට එකී එක් එක් අළුත් ගම් ප්‍රදේශය තුළ, වලංගුව පැවතිය යුතුවාත් හැර, එකී අළුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් එම අතුරු ව්‍යවස්ථා සම්පාදිත ලෙස සැලකිය යුතුය.

3. 1969 දෙසැම්බර් මස 31 වැනි දින පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ පොදු මුදලට බැරව තිබුණ මුදල් ප්‍රමාණයෙන් හතරෙන් එක් ප්‍රමාණයක් අළුත් කතරගම ගම් ප්‍රදේශයේ ගම්සභාවේ පොදු මුදලට ද හතරෙන් තුනක් වූ ප්‍රමාණයක් අළුත් බුත්තල ගම් ප්‍රදේශයේ ගම්සභාවේ පොදු මුදලට ද 1970 ජනවාරි මස 1 වැනි දින දී බෙදා බැර කළ යුතුය.

4. 1969 දෙසැම්බර් මස 31 වැනි දින බුත්තල පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාව වෙත පැවරී තිබුණ හෝ එහි පාලනය යටතේ පැවති එක් එක් ඉඩම්, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපල, 1970 ජනවාරි මස 1 වැනි දින දී එම ඉඩම, දේපළ හෝ වෙනත් නිශ්චල දේපළ පිහිටියාවූ ගම් ප්‍රදේශයේ ගම්සභාව වෙත පැවරී ඇති ලෙස සැලකිය යුතුය.

5. පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාවේ අයිතිවාසිකම්, ණයතුරුස්, බැරකම් හා බැඳීම් සියල්ලක්ම, එක් එක් අළුත් ගම් ප්‍රදේශයකට අදාළ වන තාක් 1970 ජනවාරි මස 1 වැනි දින සිට එකී අළුත් ගම් ප්‍රදේශයේ ගම්සභාවට මාරු කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

6. පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාවේ පවත්වාගෙන යනු ලැබූ සියලු ලිපිගොනු හා ලේඛන එක් එක් අළුත් ගම් ප්‍රදේශයට අදාළ වන තාක් 1970 ජනවාරි මස 1 වැනි දින සිට එකී අළුත් ගම් ප්‍රදේශයේ ගම්සභාවට කාර්යාලයට මාරු කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

7. 1969 දෙසැම්බර් මස 31 වැනි දිනට පැරණි ගම්සභාව වෙත පැවරී තිබුණ හෝ එහි පාලනය යටතේ පැවති පහත සඳහන් චංචල දේපල 1970 ජනවාරි මස 1 වැනි දිනදී කතරගම ගම් ප්‍රදේශයේ අළුත් ගම් සභාව වෙත පවරන ලද සේ සැලකිය යුතු අතර, පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාවට අයත් ඉතිරි චංචල දේපල බුත්තල අළුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව වෙත පවරන ලද සේ සැලකිය යුතුය :—

| | | |
|---|---|---|
| පියන සහිත පොත් රාක්ක | ... | 1 යි |
| යවුල් | ... | 1 යි |
| පොරෝ | ... | 1 යි |
| උදලු | ... | 7 යි |
| ස්ටොක් බාල්දි | ... | 5 යි |
| අසූචි අදින කරත්ත | ... | 2 යි |
| ඔලිම්පියා සිංහල යතුරු ලියන | ... | 1 යි |
| අලවංගු | ... | 1 යි |
| කුණු අදින කරත්ත | ... | 1 යි |
| ලියන මේස | ... | 2 යි |
| තනිගොනා බඳින කරත්ත | ... | 1 යි |
| අත් පුටු | ... | 7 යි |
| පොඩි පුටු | ... | 5 යි |
| මේස | ... | 1 යි |
| නෑති පිහියා | ... | 2 යි |

8. පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාවේ සේවයේ නියුක්තව සිටියාවූ සේවකයන් හට විශ්‍රාම වැටුප් ගෙවීම පිණිස වූ දායක මුදල් ගෙවීම පිළිබඳව ඊට ඇති වගකීම් 1 : 3 යන අනුපාතයට කතරගම සහ බුත්තල නව ගම් ප්‍රදේශයන්හි ගම්සභා අතර බෙදිය යුතුය.

9. මෙම උපලේඛනයේ—

වෙනත් අන්දමකින් සඳහන් කළොත් මිස "අළුත් ගම් ප්‍රදේශය" යනුවෙන් අදහස් කරනු ලබන්නේ 1969 මැයි මස 30 වැනි දින අංක 14,856 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවෙන් සංස්ථාපනය කර ඇති කතරගම ගම් ප්‍රදේශය වේ.

"පැරණි ගම් ප්‍රදේශය" යනුවෙන් අදහස් කරනු ලබන්නේ 1970 ජනවාරි 1 වැනි දිනට පෙර පැවති බුත්තල ගම් ප්‍රදේශය යි.

9–499—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනතේ 13 වැනි වගන්තිය යටතේ දැන්වීම

1961 අංක 60 දරණ පණතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 13(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලයේ ප්‍රකාර, පුත්තලම්-හලාවත දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්, ලියනගේ ජෝර්ජ් එඩ්වර්ඩ් වික්‍රමසේකර වන මම, පුත්තලම් දිස්ත්‍රික්කයේ විජයරාජ පළාත ගම්සභාවේ අංක 3 කොට්ඨාශයේ නියෝජිත, රිචඩ් ඇන්ටනි සැමුවෙල් ද අල්විස් මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙළින් රැස්වීම් වාර තුනකට වැඩි ගණනක් තමන් තෝරා පත්කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමට පත්ව පුත්තලම් දිස්ත්‍රික්කයේ විජයරාජ පළාත ගම් සභාවේ අංක 3 කොට්ඨාශයේ පහික, රිචඩ් ඇන්ටනි සැමුවෙල් ද අල්විස් මහතා මේ දැන්වීම ගැසට් පත්‍රයේ පළකිරීමේ දිනයේ සිට තම සභිකත්වය අත් හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

එල්. පී. ඊ. වික්‍රමසේකර,
පළාත් පාලන සහකාර කොමසාරිස් තැන,
(පුත්තලම්-හලාවත).

1970. 9. 3 වැනි දින,
හලාවත, පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලයේ දීය.

9–484—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

## ගමසභා ආඥපනත

### 17 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 පණතින් සංශෝධිත, ගමසභා ආඥපනතේ (257 වැනි අධිකාරය) 17(1) දරණ වගන්තියෙන් මා වෙත පැවරි ඇති බලතල ප්‍රකාර, අම්පාර දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්, ඇන්ටන් ඇල්ප්‍රඩ් වන මා විසින්, මෙයට යා කොට ඇති උපලේඛණයේ I වැනි තීරුවෙහි දක්වෙන, ගමසභාවේ ප්‍රථම රැස්වීමක්, එකී උපලේඛනයේ II වැනි තීරුවෙහි අනුරූපිතව දක්වෙන නියමිත දිනයේ දී ද, එකී උපලේඛනයෙහි III වැනි තීරුවෙහි අනුරූපිතව දක්වෙන නියමිත වේලාවට ද, එකී උපලේඛනයෙහි IV වැනි තීරුවෙහි අනුරූපිතව දක්වෙන නියමිත ස්ථානයේදී ද, පවත්වන බැව් මෙයින් දන්වා සිටිනු ලැබේ.

ඇන්ටන් ඇල්ප්‍රඩ්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
අම්පාර දිස්ත්‍රික්කය.

1970 සැප්තැම්බර් මස 3 වැනි දින,
කල්මුනේ පළාත් පාලන කායාාලයේ දීය.

### උපලේඛනය

| I වැනි තීරුව ගමසභාවේ නම | II වැනි තීරුව | III වැනි තීරුව වේලාව | IV වැනි තීරුව |
|---|---|---|---|
| අක්කරපත්තු මධ්‍යම | 1970.9.19 ... | පෙ.ව. 10.00ට | අක්කරයිපත්තු මධ්‍යම ගමසභා කාර්යාලය |

9–483—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

## ගම්සභා ආඥපනත

### ගම් සභා ආඥපනතේ 17 වැනි වගන්තිය යටතේවූ දන්වීමයි

1961 අංක 60 දරණ ගම් සභා ආඥපනතේ (257 වැනි අධිකාරය) 17(1) දරණ වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර යාපනයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ඇන්තනි ඇල්ප්‍රඩ් ජෝසප් වන මා විසින් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් ගම් සභාවේ පළමුවැනි සභා රැස්වීම II වැනි තීරුවේ සඳහන් දිනයේදී III වැනි තීරුවේ සඳහන් වේලාවේදී IV වැනි තීරුවේ සඳහන් ස්ථානයේදී මෙයින් කැඳවා සිටිනු ලැබේ.

ඇ. ඇ. ජෝසප්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
යාපනය.

1970 සැප්තැම්බර් මස 4 වැනි දින,
පළාත් පාලන කායර්‍යාලය, යාපනය.

#### උපලේඛනය

| I වැනි තීරුව ගම් සභාවේ නම | II වැනි තීරුව දිනය | III වැනි තීරුව වේලාව | IV වැනි තීරුව ස්ථානය |
|---|---|---|---|
| කඩ්ඩෙයිවේලි | 1970.9.19 | පෙ.ව. 10.00 | ගම්සභා කායර්‍යාලය, කඩ්ඩෙයිවේලි |

9–507—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

## දැන්වීමයි

ගම්සභා ආඥපනතේ 17 (5) වැනි වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ඕතරගම්දොළහ පත්තු ගම්සභාවේ රැස්වීමක් කැඳවීම සඳහා 1970.8.28 වැනි දින දරණ ලංකාණ්ඩුවේ (IV කොටස—පළාත් පාලන) ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ. නව දිනයක් නියම කිරීමේ දන්වීම යථා කාලයේ දී ප්‍රසිද්ධ කරමි.

ජේ. ජී. කීර්තිරත්න,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කෑගල්ල දිස්ත්‍රික්කය.

1970.9.1 වැනි දින,
කෑගල්ලේ පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලයේ දී.

9–498—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥපනත

### 17 වන වගන්තිය යටතේ වූ දැන්වීමයි

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 17 (1) වැනි වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස් බලිවර් ගුරුසිංහ වන මා විසින්, කොළඹ දිස්ත්‍රික්කයේ අතුරුගිරිය ගම්සභාවේ රැස්වීමක් 1970 සැප්තැම්බර මස 17 වැනි දින පෙරවරු 10 ට හෝමාගම පිහිටි අතුරුගිරිය ගම්සභා කාර්යාලයේදී මෙයින් කැඳවා සිටිනු ලැබේ.

බලිවර් ගුරුසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
(කොළඹ දිසාව).

1970 සැප්තැම්බර් මස 1 වැනි දින,
බටබලපිටියේ,
පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේදීය.

9–497—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥපනත

### 13 වැනි ඡේදය යටතේ කරන දැන්වීමයි

(257 වැනි අධිකාරිය වන) ගම්සභා ආඥපනතේ 13(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරෙන බලතල ප්‍රකාර, මාතර පාලන දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස්, විතානවසම් කීර්ති චන්ද්‍ර නානායක්කාර වන මම, මාතර දිස්ත්‍රික්කයේ මොරවක ගම් සභාවේ අංක 1 දරණ රබුකන කොට්ඨාශයෙහි සභික ජයසිංහ අබේවර්ධන සිරිල් මහත්මයා සභාවට දන්වීමක් නොමැතිව පිළිවෙළින් සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට, තමන් තෝරා පත් කර ගැනී මෙන් පසු නොපැමිණි බව ගැන සැහීමට පත්ව, මාතර දිස්ත්‍රික්කයේ මොරවක ගම්සභාවේ අංක 1 දරන රබුකන කොට්ඨාශයෙහි සභික ජයසිංහ අබේවර්ධන සිරිල් මහතා මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළකිරීමේ දින සිට තම සභිකත්වය අත්හරින ලද බව, මෙයින් ප්‍රකාශ කරමි.

විතානවසම් කීර්තිචන්ද්‍ර නානායක්කාර,
මාතර දිස්ත්‍රික්කයේ පළාත් පාලන
සහකාර කොමසාරිස්.

1970 අගෝස්තු මස 30 වැනි දින,
මාතර පළාත් පාලන කායර්‍යාලයේ දී ය.

9–495—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥපනත

### 17 (5) වගන්තිය යටතේවූ දන්වීමයි

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥපනතේ (257 වැනි අධිකාරය) 17 (5) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කෑගල්ල කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ජයනාදිපතිගේ ගුණපාල කීර්තිරත්න වන මා විසින් කෑගල්ල දිස්ත්‍රික්කයේ ඕතර ගම්දොළහ පත්තු ගම්සභාවට සභාපති තුමෙකු තෝරා පත්කර ගැනීම සඳහා සභා රැස්වීමක් 1970 සැප්තැම්බර් මස 18 වැනි දින පෙරවරු 10.00 ට දේවාලේගම, ඉඹුල්ගස්දෙණියේ පිහිටි ඕතර ගම්දොළහ පත්තු ගම්සභා කායර්‍යාලයේදී මෙයින් කැඳවනු ලැබේ.

ජේ. ජී. කීර්තිරත්න,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කෑගල්ල කොට්ඨාශය.

1970 අගෝස්තු මස 30 වැනි දින, කෑගල්ල
පළාත් පාලන අමාත්‍යාංශ කායර්‍යාලයේ දී ය.

9–339—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

# තනතුරු – ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි

1. දීමනා.—රජයේ නිලධාරීන්ට අදාළ වන ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ජීවනාහක දීමනාවක් ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතට හා පළාත් පාලන සේවා රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(අ) 1952 අගෝස්තු මස 8 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද, කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනික් තනතුරුද, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතට මාරුකරනු නොලැබූ ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සමාජිකයින් විසින් උසුලනු ලබද්දී, 1962 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේය.

(ආ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරුකර හරිනු ලැබුවහොත්, ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ඇ) ප්‍රාදේශීය බලමණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනත ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බලමණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඈ) පළාත් පාලන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම රෙගුලාසි යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු බවට ප්‍රකාශ කරනු නොලැබූ තනතුරුවලට කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් වූ විට, එම තනතුරුවලට පත්කරනු ලබන අය 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතෙහි 18 වන වගන්තිය යටතේ පිහිටවනු ලැබූ පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදලට, ස්වකීය වැටුපෙන් සියයට පහක් (5%) දායක මුදල් වශයෙන් ගෙවිය යුත්තාහ. අදාළ නිලධාරීන්ගේ වැටුපෙන් සියයට හත හමාරක් ($7\frac{1}{2}$%) ඔවුන් පත්කරනු ලබන ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඔවුන් වෙනුවෙන් ගෙවනු ලැබේ.

(ඉ) ස්ත්‍රීන්ද, වයස 55 ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත්කරන ලද දිනයට ඉස්සරින්ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන්ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාටම, 1952 ජූනි 30 වැනි දිනය හා 10,329 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනාත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනාත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය අනුමාන මූලික වැටුපෙන් සියයට හතරක (4%) මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ අනුමාන මූලික වැටුපෙන් සියයට තුනක (3%) දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඊ) ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත්වන්නන්ට නියම කළ හැකිය.

(උ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඌ) අන්‍යාකාරයකින් නියමකොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(එ) අයදුම්කරුවන්, නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

(ඒ) පත්කරනු ලබන අය දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කළ යුතුයි.

4. පළාත් පාලන සේවයට නව ප්‍රවේශක නිලධාරීහු.—(i) අදාළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියමකොට නැත්නම් අවුරුදු 3ක් වන්නේය.

(ii) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා දැනට පවත්නා වූත් හෝ මින්මතු සම්පාදනය කළහැකි වූ කිසියම් නියෝග හෝ නීතිරීතිවලට එකඟවීමේ කොන්දේසියට සියලුම නව ප්‍රවේශක නිලධාරීන් එකඟ විය යුතුය.

(iii) රාජකාරි කටයුතු කාර්යක්ෂම ලෙස ඉටුකිරීමෙහි ලා අත්‍යවශ්‍ය නොවන්නාවූ විශේෂ අවස්ථාවන්හිදී හැර, ඔවුන් ස්වකීය ආධුනික/වැඩ පරීක්ෂණ කාලපරිච්ඡේදය ඇතුළත රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමේ දැනුමක් ලබාගත යුතුය.

(iv) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර, නියමිත කාලසීමාව තුළදී කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයට වඩා ඉහළ නොවන මට්ටමක් දක්වා වූ සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමා ඇතුළතදී මෙම පරීක්ෂණවලින් අසමත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් එසේ නියමිත පරීක්ෂණවලින් සමත්වන තුරු, නියමිත වැටුප් වැඩිවීම් නොගෙවනු ලබන අතර, ස්වකීය ආධුනික කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසාන වනවිට, සිංහල ප්‍රවීණතාවය පිළිබඳ නියමිත තත්ත්වය ලබා ගැනීමට අසමත් වන නිලධාරීන්ගේ සේවය අවසන් කරනු ලැබිය හැකිය.

(v) අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථ්‍යය අවම සුදුසුකම වශයෙන් නියමකොට ඇත්තා වූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයයකින් සම්මානයක් තිබිය යුතුය.

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදාළ නොවේ.)

සටහන.—(i) පළාත් පාලන සේවයට ඇතුලුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබාගන්නා අය, තනතුර ස්ථිර කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වශයෙන් වූ සිංහල ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමෙන් නිදහස් කරනු ලබති.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "නව ප්‍රවේශක" යන පදය අදාල වනුයේ 1960.1.29 දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදන අනුව පළාත් පාලන සේවයේ තනතුරුවලට පළමුවරට පත්කරනු ලබන නිලධාරීන්ටය.

(iii) රජයේ සේවයෙහි නියැලිව සිට, පළාත් පාලන සේවයේ තනතුරු භාරගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නාවූ "ආදි ප්‍රවේශක නිලධාරීන්" කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) හා (iv) දරණ ඡේදවල සඳහන් විධිවිධාන අදාල නොවේ.

5. සෑම අයදුම්කරුවෙකු විසින්ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. "ලාංකිකයා" යනු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. සේවාමුක්ත භටයින් සඳහා අනුග්‍රහ.—(අ) සේවාමුක්ත වූ අයදුම් කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම්කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අවම අධ්‍යාපන සුදුසුකම, ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකාම අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරණ, වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාගන්නට තමන් සූදානම්ව සිටිද්ද නැද්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත්කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම්, රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමෙ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සළකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපැලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමුම ඒ අවදානමට මුහුණ පාති.

අන්‍යාකාරයකින් සඳහන්කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

## පළාත් පාලන සේවය

සැ.යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුරු අදළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර, ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලාගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගයී පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදළවන වෘත්තිය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

——————————තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.

(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැඳහුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :——————

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස :—

අවුරුදු :———, මාස :———, දින :———.

(ආ) උපන් දිනය :——.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :——————

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :——————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :——————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :———.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————.

10. වෘත්තීය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—.

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/ දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස් වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න.) :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සවිගත් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂා පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන්කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේනම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේනම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :—

15. මුදල් කරදරවලින් නිදහස්ද? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැ. පෙ. 530,
කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### I වැනි ශ්‍රේණියේ පුහුණු ඔපකරු තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. තෝරාගනු ලබන ඉල්ලුම්කරු ප්‍රථමවරට කොළඹ නගර සභාවට පත් කරනු ලැබේ.

3. වැටුප : තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය වර්‍ෂයකට රු. 3,240—60×12—3,960. මීට අමතරව රජයේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ද ගෙවනු ලැබේ.

4. සුදුසුකම් :

(අ) ඉල්ලුම්කරුවන් 1970. 9. 25 දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම වයස් සීමාව පළාත් පාලන සේවයේ සාමාජිකයින්ට හෝ සභා සේවකයින්ට අදාල නොවේ.)

(ආ) ඔවුන් ලාංකිකයන් විය යුතුය.

(ඇ) ඉල්ලුම්කරුවන් පිළිගත් කර්මාන්ත ශාලාවක/ආයතනයක හෝ නාගරික කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවක ගෘහ භාණ්ඩ සහ බඩු බාහිරාදිය මද්‍යසාරයෙන් දිය කළ හැකි අලතාවයන් (ප්‍රෙන්ච් පොලිෂ්) හා ඇලෙන ඔප තෙල් (සෙලූලුස් ලැකර්) ආදියෙන් ඔප දැමීම පිළිබඳව අවුරුදු 10 කට නොඅඩු පළපුරුද්දක් ලබා සිටිය යුතුය. දිය කෙරෙන අලතාමයන්, ඇලෙන ඔප තෙල් ආදිය පිළියෙල කිරීමට ඔවුනට හකි විය යුතුයි. ඔහු වැඩ පිළිබඳ මනා දැනුමත්, මෙරට ලී වර්ග හැඳිනීමට සහ වඩු කාර්මික උපකරණ පාවිච්චිය පිළිබඳ හැකියාව අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙළ කොට, 1970 සැප්තැම්බර් 25 වැනි දිනට හෝ ඊට පළමු මා වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

සඳහන් ආකෘති පත්‍රයේ 13 වැනි ඡේදය වෙනුවට මේ කරුණු යොදාගත යුතුය :—

" 13. පළපුරුද්ද පිළිබඳ විස්තර (සහතික පිටපත්) (මුල් පිටපත් නොව) ඇමිණිය යුතුයි."

7. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දිනට පෙර ලැබුණු බැව් සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

9. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණක් ලැබුණු බව දන්වනු ලැබේ.

ඩී. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1970 සැප්තැම්බර් මස 4 දින,
තැ. පෙ. 530,
කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දිය.

9–487—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### විපර් රියැදුරු තනතුරු—නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව, නගර සභාව, කොළඹ

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. වැටුප්.—තනතුරට අදාළ වැටුප් ක්‍රමය මෙසේය :—වර්ෂයකට රු. 3,120—60×14 රු. 3,960 යනුවෙනි. රජයේ නිලධාරීන්ට අදාල ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවන් ද විවාහක නිලධාරීන්ට ගෙවනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම්.—

(අ) වයස : 70.10.6 දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

(ආ) අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය :—

(i) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද, ලොරි පැදවීමට ඇති හැකියාව පිළිබඳ සහතිකය.

(ii) මෝටර් ලොරි පැදවීම හැකියාව පිළිබඳ සහතිකය ලැබීමෙන් පසුව, මෝටර් ලොරි පැදවීම පිළිබඳව තුන් අවුරුද්දකට නොඅඩු පළපුරුද්ද.

(iii) විපර් රථ පැදවීමේ පළපුරුද්ද.

(ඉහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහාත් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුයි).

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 70.10.6 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

සඳහන් කරන ලද ආකෘති පත්‍රයෙහි 7 වන අංකය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.

"7. කාර්මික සුදුසුකම් :—

(අ) මෝටර් රථ ප්‍රවාහණ කොමසාරිස් විසින් නිකුත් කරන ලද, මෝටර් ලොරි පැදවීමේ හැකියාව පිළිබඳ සහතිකය ඔබට තිබේද ?

(ආ) විපර් රථ පැදවීමේ පළපුරුද්ද පිළිබඳ සම්පූර්ණ විස්තර.

6. නියමිත ආකෘති පත්‍රයෙහි පිළියෙල නොකරන ලද අයදුම්පත්‍රද, ඉහතකී අංක 3 දරණ ඡේදයෙහි සඳහන් ලියකියවිලිවල පිටපත් අමුණා නැති අයදුම්පත්‍රද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. තෝරාගනු ලබන අයදුම්කරුවෝ මාරුකරනු ලැබීමට යටත් වෙති.

8. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ ප්‍රාදේශීය බලමණ්ඩලවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තුවල

ප්‍රධානියා හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පළමු ලැබුණු බැව් සහතික කර ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙය නිර්දේශ කළහොත් පමණි.

9. මේ තනතුර ලබා ගැනීම සඳහා ඕනෑම ආකාරයක සහාය පැතීම අයදුම්කරුවන් නුසුදුස්සන් බවට පත් කරනු ඇත.

10. අයදුම්පත්‍ර හෝ ඊට අදාල අතිකුත් ලියුම්, කොළඹ, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවිය යුතුයි.

11. සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට පමණක් ඉල්ලුම්පත්‍ර ලැබුණ බව දන්වා එවනු ලැබේ.

ඩී. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 සැප්තැම්බර් මස 3 දින,
තැ. පෙ. 530, කොළඹ.

9–488—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### ලොරි/ට්‍රැක්ටර් රියැදුරු තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. තෝරාගන්නා ලද අයදුම්කරුවන්ට ලොරි හෝ ට්‍රැක්ටර් හෝ එම වාහන දෙකම හෝ පැදවීමට නියම කරනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 3,120 න් පටන් ගෙන, වර්ෂයකට රු. 60 බැගින් 14 වරක් වැඩිවී වර්ෂයකට රු. 3,960 දක්වා නගී. රජයේ නිලධාරීන්ට අදාළ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ද විවාහක නිලධාරීන්ට ගෙවනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම්.—

(i) වයස? 1970.10.6 වැනි දිනට අවුරුදු 45ට නොවැඩි විය යුතුයි. (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

(ii) අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි:—

(අ) මෝටර් ලොරි පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහණ කොමසාරිස්ගෙන් 1965.10.5 වැනි දිනට පළමු ප්‍රවීණතා පිළිබඳ සහතිකය ලබාගෙන තිබිය යුතු අතර, යහපත් වාර්තාවක් තිබිය යුතුය.

(ආ) මෝටර් ලොරි පැදවීම පිළිබඳ බලපත්‍රය ලැබීමෙන් පසු අවුරුදු පහක (5) පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

(ඇ) ට්‍රැක්ටර් රථ පැදවීමේ ප්‍රවීණතාවය පිළිබඳ මෝටර් රථ ප්‍රවාහණ කොමසාරිස්ගෙන් ලත් සහතිකය තිබිය යුතු අතර, යහපත් වාර්තාවක් තිබිය යුතුය.

(ඇ) ට්‍රැක්ටර් රිය පැදවීමේ පළපුරුද්දක් තිබිය යුතුය.

(ඉ) මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතුය. (ආ), (ඇ) හා (ඉ) ඡේදයන්හි කරුණු ඔප්පු කිරීම සඳහා සහතික පිටපත් ඇමිණිය යුතුය.

4. ප්‍රාදේශීය බලමණ්ඩලවල ස්ථිර සේවයේ සිටින නිලධාරීන්ගේ අයදුම්පත්, ඔවුන්ට අනික් සුදුසුකම් ඇත්නම්, වයස පිළිබඳ නියමය නොසලකා, සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම්පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘතිපත්‍රයට අනුව පිළියෙල කොට 1970.10.6 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

සඳහන් කරන ලද ආකෘති පත්‍රයෙහි 13 වැනි අංකය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය:—

"13. සම්පූර්ණ විස්තර සඳහන් කරන්න—

(අ) මෝටර් ලොරි පැදවීමේ බලපත්‍රය ලැබූ දිනය:————.

(ආ) බලපත්‍රයේ අංකය:————.

(ඇ) බලපත්‍රය ලැබීමෙන් පසු පළපුරුද්ද පිළිබඳ අවුරුදු ගණන (ලොරි රියැදුරෙකු ලෙස හෝ ට්‍රැක්ටර් රියැදුරෙකු ලෙස කළ රක්ෂාව පිළිබඳ විස්තර දිය යුතුයි). සහතික පිටපත්වලින් මේ කරුණු ඔප්පු කළ යුතුයි:————.

(ඇ) මෝටර් යන්ත්‍ර විද්‍යාව පිළිබඳ දැනුම:————. (සහතික පිටපත්වලින් මෙ කරුණු ඔප්පු කළ යුතුය).

(ඉ) බලපත්‍රයේ දැනටමත් ඇති සටහන්වල විස්තර හා ඒවායේ ස්වභාවය:————.

(ඊ) ට්‍රැක්ටර් රථ පැදවීමෙ ප්‍රවීණතාවය පිළිබඳව මෝටර් රථ ප්‍රවාහණ කොමසාරිස්ගේ සහතිකය ලබා තිබේද යන වග:————.

7. නියමිත ආකෘතිපත්‍රයෙහි පිළියෙල නොකරන ලද අයදුම්පත්‍රද, පහත සඳහන් ලියකියවිලිවල පිටපත් අමුණා නැති අයදුම්පත්‍ර ද ප්‍රතික්ෂේප කරනු ලැබේ:—

(i) මෝටර් ලොරි පැදවීම පිළිබඳ බලපත්‍ර ලැබීමෙන් පසු අවුරුදු 5 කට නොඅඩු පළපුරුද්ද පිළිබඳ සහතිකය.

(ii) මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැනුම ඔප්පු කිරීම සඳහා සහතිකය.

(iii) ට්‍රැක්ටර් රථ පැදවීමට ඇති හැකියාව පිළිබඳ සහතිකය.

8. තෝරාගනු ලැබූ අයදුම්කරුවන්ට දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කරන ලෙස නියම කරනු ලැබේ. ඔවුන් හොඳ චරිතයෙන් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන්ද යුක්ත විය යුතුය.

9. තෝරාගනු ලැබූ අයදුම්කරුවන්ට ප්‍රාදේශීය බලමණ්ඩල සීමාව ඇතුළත පදිංචි වීමට නියම කෙරෙන අතර, ඔවුහු මාරු කරනු ලැබීමට යටත් වෙති.

10. නියමිත දිනට පසුව මෙ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ ප්‍රාදේශීය බලමණ්ඩලවල, සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානියා හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පළමු ලැබුණු බැව් සහතික කර ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

11. මෙ තනතුර ලබා ගැනීම සඳහා ඕනෑම ආකාරයක සහාය පැතීම අයදුම්කරුවන් නුසුදුස්සන් බවට පත් කරනු ඇත.

12. අයදුම්පත්‍ර හෝ ඊට අදාල අතිකුත් ලියුම් එවිය යුත්තේ, කොළඹ, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මෙ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

13. සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට පමණක් ඉල්ලුම් පත්‍ර ලැබුණ බව දන්වා එවනු ලැබේ.

ඩී. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 සැප්තැම්බර් 3 දින,
තැ. පෙ. 530, කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

9–489—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

# අතුරු ව්‍යවස්ථා

ඇල්.ඞී.—බී. 58/35.

## නාවලපිටිය නගර සභාව

### නගර සභා ආඥපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥපනතේ 153 (1) වැනි වගන්තිය යටතේ නාවලපිටිය නගර සභාව විසින් සම්පාදිතව එකී ආඥපනතේ 154 (1) වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970. 8. 26 දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

මෙහි වූ උපලේඛනයෙහි විස්තර කරනු ලබන ස්ථාන 1970 වර්ෂය සඳහා (255 වැනි අධිකාරය වන) නගර සභා ආඥපනතේ 130 (ආ) වැනි වගන්තිය යටතේ නාවලපිටිය නගර සභාව විසින් අයකරනු ලබන්නාවූද, 1970 පෙබරවාරි මස 20 වැනි දින අංක 14,894 දරන ගැසට් පත්‍රයේ පළවූ 1970 පෙබරවාරි මස 8 වැනි දින දරන නිවේදනයෙහි සඳහන් වූද කසළ ශෝධනය පිළිබඳ විශේෂ බද්දෙන් නිදහස් විය යුතුය.

#### උපලේඛනය

කොත්මලේ පාර—අංක 22, 93.
සොයිසාකැලේ පාර—අංක 2.
ටෙම්පල් ටෙරස්—අංක 8.
අංක 3 පටු මාවත—අංක 4.
අඹගමුව පාර—අංක 25, 27, 163/2.

9–491—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඞී.—බී. 144/47.

## ගම්සභා ආඥපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 42 වෙනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ වැකේ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පනවනු ලැබ ඒ වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970. 8. 26 දින,
කොළඹ දී ය.

### වෙළෙඳ පොළටල් සහ පොළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. කොළඹ දිස්ත්‍රික්කයේ වැකේ ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් පිළිගන්නා ලද වෙළඳ පළවල් හා පොළවල් පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාවල (xxvii) වැනි කොටසේ 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා කිරිදිවැල ගම්බද වෙළඳපළ සම්බන්ධයෙන්වූ වෙළඳ ප්‍රදේශය එකී වෙළඳ පොළේ සිට සැතපුම් එකක අර්ධ විෂ්කම්භ කවයක් ඇතුළත ප්‍රදේශය විය යුතුයි.

2. (1) සභාව විසින් පිහිටුවන ලද ගම්බද වෙළඳපළක කඩ කාමරයක්, බක්කියක් හෝ ඉඩ කඩිත්තක් ප්‍රයෝජනයට ගන්නාවූ හෝ පාවිච්චි කරන්නාවූ සෑම තැනැත්තෙකු විසින්ම එසේ ප්‍රයෝජනයට ගැනීම හෝ පාවිච්චි කිරීම සඳහා මෙහි වූ උපලේඛනයේ සඳහන් ප්‍රමාණ අනුව ගාස්තුවක් ගෙවිය යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාව" යන්නෙන් කොළඹ දිස්ත්‍රික්කයේ වැකේ ගම් ප්‍රදේශයේ ගම් සභාව අදහස් කෙරේ.

#### උපලේඛනය

| | දිනකට ගාස්තුව ශත |
|---|---|
| (1) වෙළඳපොළ ගොඩනැගිල්ල තුළ හතරැස් අඩි 75කට වැඩි නොවන කඩ කාමරයක් කඩ බක්කියක් හෝ කඩිත්තක් සඳහා ... ... | 65 |
| (2) වෙළඳපොළ භූමියෙන් කඩ කාමරයක් සඳහා එවැනි කඩ කාමරයක්— | |
| (අ) හතරැස් අඩි 50 කට වැඩි නොවන විට ... | 45 |
| (ආ) හතරැස් අඩි 50 කට වැඩි වන එහෙත් හතරැස් අඩි 75 කට වැඩි නොවන විට ... | 65 |
| (ඇ) හතරැස් අඩි 75 කට වැඩි වන එහෙත් හතරැස් අඩි 100 කට වැඩි නොවන විට ... | 80 |
| (3) එළිමහන් බිම් කඩබක්කියක්, හෝ ඉඩ කඩිත්තක් සඳහා එවැනි කඩ බක්කියක් හෝ ඉඩ කඩිත්තක්— | |
| (අ) හතරැස් අඩි 9කට වැඩි නොවන විට ... | 10 |
| (ආ) හතරැස් අඩි 9 කට වැඩි වන එහෙත් හතරැස් අඩි 25 කට වැඩි නොවන විට ... | 20 |
| (ඇ) හතරැස් අඩි 25 කට වැඩි වන එහෙත් හතරැස් අඩි 50කට වැඩි නොවන විට ... | 40 |
| (ඈ) හතරැස් අඩි 50 කට වැඩි වන එහෙත් හතරැස් අඩි 100 කට වැඩි නොවන විට ... | 60 |

9–492—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

එල්.ඞී.—බී. 1/70.

## ගම්සභා ආඥපනත

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥපනතේ 42 වෙනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ තාරණ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පනවනු ලැබ, ඒ වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970. 8. 28 දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

I. පහත සඳහන් ව්‍යාපාර අන්තරාදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

1. සිසිල් බීම වර්ග සෑදීම.
2. උපකරණ මගින් තෙල් සිඳීම.
3. කබුක් බොරළු හෝ කලුගල් සඳහා වළවල් කැපීම.
4. පිදුරු ගබඩා කිරීම.
5. කෙඳිවර්ග සෑදීම හෝ ගබඩා කිරීම.
6. කම්මලක් පවත්වාගෙන යාම.
7. ලී ගබඩාවක් පවත්වාගෙන යාම.
8. ස්වර්ණාභරණ සෑදීම.
9. මුද්‍රණ යන්ත්‍රාලයක් පවත්වාගෙන යාම.
10. බයිසිකල් අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
11. මෝටර් රථ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
12. වඩුමඩුවක් පවත්වාගෙන යාම.
13. ගඩොල් හෝ උළු පිළිස්සීම.
14. ටයර් හෝ ටියුබ් වෝල්කැනයිස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
15. අඟුරු ගබඩා කිරීම.
16. වී කොටන හෝ පාගින මෝලක් පවත්වාගෙන යාම.
17. යන්ත්‍රානුසාරයෙන් මිරිස් හෝ කුළුබඩු ඇඹරීම.
18. යන්ත්‍රානුසාරයෙන් තිරිඟු, කුරක්කන් හා වෙනත් ධාන්‍යවර්ග ඇඹරීම.

19. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.
20. යිස් ගෝනි ගබඩා කිරීම.
21. අම්ලකර වායුව පාවිච්චි කරන කම්හලක් තබා ගැනීම.
22. කොප්පරා සෑදීම.
23. වළවල් කැණීමෙන් හුණුගල් ලබා ගැනීම.
24. යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් සිඳීම.
25. සෙක්කුවෙන් පොල්තෙල් සිඳීම.
26. කොප්පරා ගබඩා කිරීම.
27. තෙල්වලින් හෝ වෙනත් ඉන්ධන වලින්, වාෂ්ප වලින් හෝ විදුලි බලයෙන් ක්‍රියාකරන යන්ත්‍ර පාවිච්චි කරන යම් ව්‍යාපාරයක්.
28. කපු හෝ කොට්ට පුළුන් ගබඩා කිරීම.
29. අම්ලකර වායුව පාවිච්චි කරන ගරාජයක් පවත්වාගෙන යාම.
30. කොහු සෑදීම හෝ ගබඩා කිරීම.
31. ගෘහ භාණ්ඩ සෑදීම.
32. භූමිතෙල් ගබඩාවක් තබා ගැනීම.
33. කපාපු පොල් නිෂ්පාදනය.
34. කොහු මෝලක් තබා ගැනීම.
35. හාල් මෝලක් තබා ගැනීම.
36. පැඟිරිතෙල් හෝ කුරුඳු තෙල් සිඳීම.
37. හිනිකුරු සෑදීම.
38. ලී ඉරන මෝලක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම.
39. අම්ලකර යොදා පැස්සීම.
40. මිනිරන් සකස් කිරීම හෝ ගබඩා කිරීම.

2. පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය:—

1. ජාඩි හෝ කරෝල ගබඩා කිරීම.
2. තොග ගණනේ විකිණීම පිණිස තරක්වන සුලු ආහාර හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.
3. කෘතිම පොහොර හෝ කොම්පෝස් පොහොර සෑදීම.
4. විනාකිරි සෑදීම.
5. සබන් සෑදීම.
6. හම් පදම් කිරීමේ ස්ථානයක් තබා ගැනීම.
7. සතුන්ගේ ලේ හෝ අවමස් උණුකිරීම.
8. හම් ගබඩා කිරීම.
9. සතුන්ගේ ඇටකටු ගබඩා කිරීම.
10. ලැලි පොහවා සකස් කිරීම.
11. කෘතිම පොහොර සෑදීම හෝ කෘතිම පොහොර සාදා ගැනීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි 3කට වඩා තබා ගැනීම.
12. රා එකතු කරන ස්ථානයක් තබා ගැනීම.
13. බීඩි කර්මාන්තය.
14. සුරුට්ටු කර්මාන්තය.
15. මිනීපෙට්ටි සෑදීම හෝ ගබඩා කිරීම.
16. සිමෙන්ති ගබඩාකර තැබීම.
17. තීන්ත හෝ වාර්නිෂ් වර්ග ගබඩා කිරීම.
18. බෙලෙක් වැඩපළක් තබා ගැනීම.
19. දුම්කොළ වියළීම හෝ සකස් කිරීම.
20. පුවක් වේලා සකස් කිරීම.
21. රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් සෑදීම.
22. සෝඩා සෑදීම.
23. මාළු අසිස් දැමීම.
24. පැණි හෝ හකුරු සෑදීම.
25. දර මඩුවක් පවත්වාගෙන යාම.
26. දුම්කොළ ගබඩා කිරීම.
27. උළු හෝ ගඩොල් ගබඩා කිරීම.
28. පොල්ලෙලි පල්කිරීම සඳහා ලෙලිවළක් පවත්වාගෙන යාම.
29. යකඩ බඩු තබා ගැනීම, ගබඩා කිරීම සහ විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
30. ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
31. විකිණීම පිණිස වී ගෝනි 50 කට වඩා වී ගබඩා කිරීම.
32. ෂීට් රබර් ගබඩා කිරීම.
33. කොහු හෝ කොහුවලින් හෝ කෙඳිවලින් සෑදූ භාණ්ඩ ගබඩා කිරීම.
34. වේවැල් බඩු සෑදීම.
35. තල තෙල් සෑදීම.

3. පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුයි:—

1. කෙඳි සායම් කිරීම.
2. ගඩොල් හෝ උළු පිළිස්සීම.
3. බැටරි චාජ් කිරීම.
4. හුණුගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම, හෝ කඩා කැබලි වලට සකස් කිරීම.
5. අඟුරු සඳහා ලී හෝ පොල්කටු පිළිස්සීම.

9–493—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී. 9/70

## ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ අපරැක්ක-බබරැන්ද ගම්සභාව විසින් සම්පාදිතව, ඒ වගන්තියේ (3) වන උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970. 8. 27 දින.
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

(1) පහත සඳහන් ව්‍යාපාර අන්තරාදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය:—

හාල් මෝලක් තබා ගැනීම.
කොහු මෝලක් තබා ගැනීම.
ලී ඉරන මෝලක් හෝ ලී ඉරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
භූමිතෙල් ගබඩාවක් තබා ගැනීම.
කපාපු පොල් නිෂ්පාදනය කිරීම.
පැඟිරි තෙල් හෝ කුරුඳු තෙල් සිඳීම.
කම්මලක් පවත්වාගෙන යාම.
ලී ගබඩාවක් පවත්වාගෙන යාම.
ස්වර්ණාභරන සෑදීම.
මුද්‍රණ යන්ත්‍රාලයක් පවත්වාගෙන යාම.
බයිසිකල් අළුත් වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
මෝටර් රථ අළුත් වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
වඩු මඩුවක් පවත්වාගෙන යාම.
ගඩොල් හෝ උළු පිච්චීම.
ටයර් හෝ ටියුබ් වොල් කැනයිස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
අඟුරු ගබඩා කිරීම.
වී කොටන හෝ පහින මෝලක් පවත්වාගෙන යාම.
යන්ත්‍රානුසාරයෙන් මිරිස් හෝ කුළු බඩු ඇඹරීම.
තිරිඟු, කුරක්කන් හා වෙනත් ධාන්‍ය වර්ග ඇඹරීම සඳහා යන්ත්‍රයක් තබා ගැනීම.
ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.
හිස් ගෝනි ගබඩා කිරීම.
අම්ලකර වායුව පාවිච්චි කරන කම්හලක් තබා ගැනීම.
කොප්පරා සෑදීම.
වළක් කැනීමෙන් හුණු ගල් ලබා ගැනීම.
යන්ත්‍රානුසාරයෙන් පොල් තෙල් සිඳීම.
සෙක්කුවෙන් පොල් තෙල් සිඳීම.
කොප්පරා ගබඩා කිරීම.
තෙල් වලින් හෝ වෙනත් ඉන්ධන වලින්, වාෂ්පවලින් හෝ

විදුලිබලයෙන් ක්‍රියා කරන යන්ත්‍ර පාවිච්චි කරන යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

කපු පුළුන් ගබඩා කිරීම.

අම්ලකර වායුව පවිච්චි කරන ගරාජයක් පවත්වාගෙන යෑම.

කොහු සෑදීම හෝ ගබඩා කිරීම.

ගෘහ භාණ්ඩ සෑදීම.

සිසිල් බීම වර්ග සෑදීම.

උපකරණ මගින් තෙල් සිඳීම.

කබුක් බොරළු හෝ කළුගල් සඳහා වලවල් කැපීම.

පිදුරු ගබඩා කිරීම.

කොහු හෝ කෙඳි වර්ග සෑදීම සහ ගබඩා කිරීම.

ගිනිකූරු සෑදීම සහ ගබඩා කිරීම.

අම්ලකර යොදා පැස්සීම් කරන ආයතනයක් තබා ගැනීම.

මිනිරන් සකස් කිරීම සහ ගබඩා කිරීම.

(2) පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

ජාඩි හෝ කරෝල ගබඩා කිරීම.

තොග ගණනේ විකිණීම පිණිස නරක්වන සුළු ආහාර හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.

කෘතිම පොහොර හෝ කොම්පෝස් පොහොර සෑදීම.

විනාකිරි සෑදීම.

සබන් සෑදීම.

හම් පදම් කිරීමේ ස්ථානයක් තබා ගැනීම.

සතුන්ගේ ලේ හෝ අවමස් උණු කිරීම.

හම් ගබඩා කිරීම.

සතුන්ගේ ඇට කටු ගබඩා කිරීම.

ලැලි පොහොර සකස් කිරීම.

කෘතිම පොහොර සෑදීම හෝ කෘතිම පොහොර සාදා ගැනීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි 3 කට වඩා තබා ගැනීම.

රා එකතු කරන ස්ථානයක් තබා ගැනීම.

බීඩි කර්මාන්තය පවත්වා ගෙන යාම.

සුරුට්ටු කර්මාන්තය පවත්වාගෙන යාම.

මිනී පෙට්ටි සෑදීම හෝ ගබඩා කිරීම.

සිමෙන්ති ගබඩා කිරීම.

තීන්ත වර්ග හෝ වාර්නිස් වර්ග ගබඩා කිරීම.

බෙලෙක් වැඩ පලක් තබා ගැනීම.

දුම්කොළ වියලීම හෝ සකස් කිරීම.

පුවක් වේලා සකස් කිරීම.

රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් සෑදීම.

කෝඩා සෑදීම.

(3) පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

කෙඳි සායම් කිරීම.

ගබොල් හෝ උළු පිලිස්සීම.

බැටරි චාජ් කිරීම.

හුණු ගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කඩා කැබලි වලට සකස් කිරීම.

අඟුරු සඳහා ලී හෝ පොල් කටු පිලිස්සීම.

මාළු අයිස් දැමීම.

පැණි හෝ හකුරු සෑදීම.

දර මඩුවක් පවත්වාගෙන යෑම.

දුම්කොළ ගබඩා කිරීම.

උළු හෝ ගබොල් ගබඩා කිරීම.

පොල්ලෙලි පල් කිරීම සඳහා ලෙලි වලක් පවත්වාගෙන යාම.

යකඩ බඩු විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

ගුවන් විදුලි යන්ත්‍ර අළුත් වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

ෂීට් රබර් ගබඩා කිරීම.

කොහු හෝ කොහු වලින් හෝ කෙඳි වලින් සෑදූ භාණ්ඩ ගබඩා කිරීම.

තලතෙල් සිඳීම.

සත්ව තෙල් සිඳීම.

රබර් ෂීට් වියලීම සඳහා දුම්ගෙයක් පැවැත්වීම.

බාබර් සාප්පුවක් (කරණ වෑම් මැදිරි) පැවැත්වීම.

රෙදි පිරිසිදු කරන ස්ථානයක් (ලොන්ඩ්‍රියක්) පැවැත්වීම.

9–496—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ජී.—බී. 39/51

## විශේෂ කොමසාරිස් කාර්යාලය—දර්ගා නගරය

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 වැනි සහ 156 වැනි වගන්ති යටතේ දර්ගා නගරයේ විශේෂ කොමසාරිස් විසින් පනවනු ලැබ, ඒ ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 28 වන දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

1. පහත සඳහන් ව්‍යාපාර අන්තරාදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

කොප්පරා නිෂ්පාදනය කිරීම.

කොප්පරා ගබඩා කිරීම.

කබුක් ගල් හෝ බොරළු ලබා ගැනීමට ගල්වලවල් කැපීම.

කපාපු පොල් නිෂ්පාදනය කිරීම.

යන්ත්‍රානුසාරයෙන් පොල් තෙල් නිෂ්පාදනය කිරීම.

තෙල් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.

පිදුරු ගබඩා කිරීම.

කෙඳි වගී නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කිරීම.

දර මඩුවක් පවත්වාගෙන යෑම.

ස්වර්ණාභරණ සෑදීම.

මුද්‍රණාලයක් පවත්වාගෙන යෑම.

හාල් මෝලක් හෝ හාල් පාහින යන්ත්‍රයක් පවත්වාගෙන යෑම.

වී කෙටීම සඳහා මෝලක් හෝ ඇඹරුම් මෝලක් පවත්වාගෙන යෑම.

සිසිල් බීම නිෂ්පාදනය කිරීමේ ආයතනයක් පවත්වාගෙන යෑම.

තෙල් වලින් හෝ වෙනත් යම් ඉන්ධනයකින් හෝ වාෂ්ප බලයෙන් හෝ විදුලි බලයෙන් ක්‍රියා කරවනු ලබන යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ආයතනයක් පවත්වාගෙන යෑම.

ලී මඩුවක් පවත්වගෙන යෑම.

කම්මලක් පවත්වාගෙන යෑම.

ලී බඩු සෑදීම.

මෝටර් සයිකල් හෝ මෝටර් වාහන අළුත්වැඩියා කිරීම හෝ සර්විස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.

බයිසිකල් අළුත්වැඩියා කරන වැඩ පොලක් පවත්වාගෙන යෑම.

ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යෑම.

පරණ ලෝහ ගබඩා කිරීම.

කපු පුළුන් ගබඩා කිරීම.

ෂීට් රබර් හෝ ක්‍රේප් රබර් සකස් කිරීම.

අම්ලකර පැස්සීම් මගින් කම්මල් වැඩ කරනු ලබන යම් ව්‍යාපාරයක්.

ගිනිකූරු සෑදීම.

ලියවන පට්ටලයක් පාවිච්චි කරනු ලබන වැඩ පොලක් පවත්වාගෙන යෑම.

ටයර් සහ ටියුබ් වෝල්කනයිසින් කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.

ගල් අඟුරු ගබඩා කිරීම.

ලී ඉරුම් පට්ටලයක් පවත්වාගෙන යෑම.

හිස් බෝතල ගබඩා කිරීම.

භූමිතෙල් ගබඩා කිරීම.

තීන්ත, වාර්නිෂ් සහ ටර්පන්ටයින් ස්ප්‍රීතු ගබඩා කිරීම.

2. පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය:—

මාළු ජාඩි දැමීම හෝ කරවලවලට වේලීම.

විකිණීම සඳහා නරක්වන සුළු ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.

විනාකිරි සෑදීම.

පුවක් වියලා සකස් කිරීම.

හම් ගබඩා කිරීම.

මාළු අයිස් දැමීම.

ලෑලි පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යෑම.

සෝඩා සෑදීම.

සුරුට්ටු සෑදීම.

රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.

බීඩි සෑදීම.

කෘත්‍රිම පෝර ගබඩා කිරීම.

උම්බලකඩ ගබඩා කිරීම.

ගෝනි ගබඩා කිරීම.

හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.

ලේ හෝ අවමස් උණු කිරීම.

සබන් සෑදීම.

දුම්කොළ වියලීම හෝ සකස් කිරීම.

පොල් ලෙලි පල් කිරීම සඳහා කොටුවක් පවත්වා ගෙන යෑම.

3. පහත සඳහන් ව්‍යාපාර අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය:—

කෙඳි සායම් කිරීම.

ගබොල් හෝ උළු නිෂ්පාදනය කිරීම.

බැටරි පිරවීම.

මිනිරන් සුද්ද කිරීම හෝ ගබඩා කිරීම.

හුණු පිලිස්සීම හෝ ගබඩා කිරීම.

9-515—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 42 වැනි වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ රංසෑගොඩ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පනවනු ලැබ ඒ වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අගෝස්තු 27 වන දින,
කොළඹ දී ය.

### වෙළෙඳ පොලවල් සහ පොළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. මාතර දිස්ත්‍රික්කයේ රංසෑගොඩ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පිළිගන්නා ලද වෙළෙඳ පොළවල් හා පොළවල් පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාවල XXVII වැනි කොටසේ 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා මාකඳුර වෙළෙඳ පොළට අයත් වෙළඳ ප්‍රදේශය, එකී වෙළෙඳ පොළේ සිට සැතපුම් කාලක අර්ධ විෂ්කම්භයකින් නිරූපිත වෘත්තයට ඇතුළත් වන ප්‍රදේශය විය යුතුය.

2. "මාකඳුර" වෙළෙඳ පොළේ යම්කිසි බිම් ප්‍රමාණයක් හෝ වෙළඳ පිළක් පාවිච්චි කිරීම් හෝ ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් පහත සඳහන් ප්‍රමාණයන් අනුව ගාස්තුවක් පනවා අය කළ යුතුයි:—

| | දිනකට ගාස්තුව රු. ශ. |
|---|---|
| (1) එක් එක් වෙළෙඳ පිළ සඳහා ... | 1 50 |
| (2) හතරැස් අඩි 4කට නොවැඩි එක් එක් බිම් ප්‍රමාණය සඳහා ... ... | 0 20 |
| (3) හතරැස් අඩි 4කට වැඩි එහෙත් හතරැස් අඩි 20 කට නොවැඩි එක් එක් බිම් ප්‍රමාණය සඳහා... | 0 50 |
| (4) හතරැස් අඩි 30කට වැඩි නොවන්නා වූ එක් එක් බිම් ප්‍රමාණයක් සඳහා ... | 0 75 |
| (5) හතරැස් අඩි 50කට වැඩි නොවන්නා වූ එක් එක් බිම් ප්‍රමාණයක් සඳහා ... | 1 0 |
| (6) හතරැස් අඩි 100කට වැඩි නොවන්නා වූ එක් එක් බිම් ප්‍රමාණයක් සඳහා ... | 1 50 |

3. වෙළෙඳ පොළේ එළිමහන් ප්‍රදේශයේ කඩ බක්කියක් හෝ ඉඩ ප්‍රමාණයක් සඳහා පහත සඳහන් ප්‍රමාණයක් අනුව ගාස්තුවක් පනවා අය කළ යුතුය:—

| | රු. ශ. |
|---|---|
| (අ) බිම් ප්‍රදේශයේ හතරැස් අඩි 8කට වැඩි නොවන්නාවූ විට එක් දිනකට ... ... | 0 20 |
| (ආ) බිම් ප්‍රදේශයේ හතරැස් අඩි 8කට වැඩි වන්නා වූ එහෙත් හතරැස් අඩි 25කට වැඩි නොවන්නා වූ විට එක් දිනකට ... | 0 30 |
| (ඇ) බිම් ප්‍රදේශයේ හතරැස් අඩි 25කට වැඩි වන්නා වූ එහෙත් හතරැස් අඩි 50කට වැඩි නොවන්නා වූ විට එක් දිනකට ... | 0 40 |
| (ඈ) බිම් ප්‍රදේශයේ හතරැස් අඩි 50කට වැඩි නොවන්නා වූ එහෙත් හතරැස් අඩි 100කට වැඩි නොවන්නා වූ විට එක් දිනකට ... | 0 50 |

9-517—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඕ.—බී. 5/70

## ගම්සභා ආඥපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 42 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තු පල්ලේගම්පහ උතුර ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව එම වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අගෝස්තු 28 වන දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

1. පහත දැක්වෙන ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුයි:—

(1) ජාඩි හෝ කරවල ගබඩා කිරීම.

(2) තොග ගණනේ විකිණීම සඳහා නරක්විය හැකි ආහාර සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.

(3) කොම්පෝස්ට් පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීම.

(4) විනාකිරි සෑදීම.

(5) සබන් සෑදීම.

(6) දුම්කොළ වියලීම සහ සකස් කිරීම.

(7) හම් පදම්කරන ස්ථානයක් තබා ගැනීම.

(8) පුවක් වියලා සකස් කිරීම.

(9) ලේ හෝ අවමස් උණු කිරීම.

(10) සතුන්ගේ හම් හෝ ඇටකටු ගබඩා කිරීම.

(11) ෂීට් රබර් හෝ ක්‍රේප් රබර් නිෂ්පාදනය සහ ගබඩා කිරීම.

(12) කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය හෝනි තුණකට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.

(13) සෝඩා සෑදීම.

(14) ලෑලි පොගවා සකස් කිරීම.

(15) මාළු අයිස් දැමීම.

(16) සුරුට්ටු හෝ බීඩි සෑදීම.

(17) රූ එකතුකරන ස්ථානයක් පවත්වාගෙන යාම.

(18) පැණි හෝ හකුරු සෑදීම.

(19) වයර් හෝ විදුලි වෙල්ඩින්සිසින් කරන ස්ථානයක් තබා ගැනීම.

(20) බෙලෙක් වැඩපලක් තබා ගැනීම.

(21) සිමෙන්ති ගබඩා කිරීම.

(22) තීන්ත හෝ වාර්නිෂ් ගබඩා කිරීම.

(23) මිනී පෙට්ටි සෑදීම හෝ ගබඩා කිරීම.

2. පහත දැක්වෙන ව්‍යාපාර අන්තරාදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුයි :—

(1) කොප්පරා සෑදීම හෝ ගබඩා කිරීම.

(2) කබොක්, බොරළු හෝ කළුගල් සඳහා වලවල් කැපීම.

(3) මිනිරන් වියලා සකස් කිරීම හෝ ගබඩා කිරීම.

(4) වලවල් කැණීමෙන් හුණු ගල් ලබාගැනීම.

(5) හාල් මෝලක් හෝ ඇඹරුම් මෝලක් තබාගැනීම.

(6) යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් සිඳීම.

(7) සෙක්කුවලින් පොල්තෙල් සිඳීම.

(8) දර හෝ ලී මඩුවක් තබාගැනීම.

(9) කෙඳි වර්ග තෙලීම හෝ ගබඩා කිරීම.

(10) කපු පුළුන් හෝ පිදුරු ගබඩා කිරීම.

(11) මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.

(12) කපාපු පොල් නිෂ්පාදනය කිරීම.

(13) ස්වර්ණාභරණ සෑදීම.

(14) වඩු මඩුවක් පවත්වාගෙන යාම.

(15) පැඟිරි තෙල් හෝ කුරුඳු තෙල් නිෂ්පාදනය කිරීම.

(16) කොප්පරා ගබඩා කිරීම.

(17) පිදුරු ගබඩා කිරීම.

(18) කම්හලක් පවත්වාගෙන යාම.

(19) ධයිල්බීම නිෂ්පාදනය කිරීම.

(20) ගල්වලක් පවත්වාගෙන යාම.

(21) හාල් පාගින මෝලක් පවත්වාගෙන යාම.

(22) මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

(23) බයිසිකල් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

(24) තේ කර්මාන්තශාලාවක් තබාගැනීම.

(25) අම්ලකර වායුව පාවිච්චිකරන කම්හලක් තබාගැනීම.

(26) කළුගල් කඩන හෝ පුපුරවන ස්ථානයක් තබාගැනීම.

(27) හිස් ගෝනි ගබඩා කිරීම.

(28) ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.

(29) යන්ත්‍රානුසාරයෙන් මිරිස් හෝ තුණපහ ඇඹිරීම.

3. පහත දැක්වෙන ව්‍යාපාර අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර ලෙස සැලකිය යුතුය :—

(1) කෙඳි සායම් කිරීම.

(2) බැටරි චාජ්කිරීම.

(3) ගඩොල් හෝ උළු නිපදවීම.

(4) හුණු ගල් පිච්චීම, ගබඩාකිරීම, සකස් කිරීම හෝ කුඩා කැබලි වලට කැඩීම.

(5) තෙල් හෝ වෙනත් ඉන්ධනවලින් හෝ වාෂ්ප බලයෙන් හෝ විදුලිබලයෙන් ක්‍රියාකරන යන්ත්‍රෝපකරණ පාවිච්චි කරනු ලබන කර්මාන්ත ශාලාවක් තබා ගැනීම.

(6) අඟුරු ලබාගැනීම සඳහා පොල්කටු පිළිස්සීම.

9-520—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

එල්.ඕ.—ඕ. 74/48.

## ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ බින්තැන්න දකුණ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පනවනු ලැබ ඒ වගන්තියේ (3) වෙනි උපවගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අගෝස්තු 28 වැනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

## අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. පහත සඳහන් ව්‍යාපාර අන්තරාදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

සිසිල් බීම වගී සෑදීම.

උපකරණ මගින් තෙල් සිඳීම.

කබුක්, බොරළු හෝ කළුගල් සඳහා වළවල් හෑරීම.

පිදුරු ගබඩා කිරීම.

කෙඳිවගී සෑදීම හෝ ගබඩා කිරීම.

කම්මලක් පවත්වා ගෙන යාම.

ලී ගබඩාවක් පවත්වා ගෙන යාම.

ස්වර්ණාභරණ සෑදීම.

මුද්‍රණ යන්ත්‍රාලයක් පවත්වා ගෙන යාම.

බයිසිකල් අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වා ගෙන යාම.

මෝටර් රථ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වා ගෙන යාම.

වඩුමඩුවක් පවත්වා ගෙන යාම.

වයර් හෝ විද්‍යුත් වෙල්ඩින්සිසින් කරන ස්ථානයක් පවත්වා ගෙන යාම.

අඟුරු ගබඩා කිරීම.

වී කොටන හෝ පාගින මෝලක් පවත්වා ගෙන යාම.

යන්ත්‍රානුසාරයෙන් මිරිස් හෝ කුළුබඩු ඇඹරීම.

යන්ත්‍රානුසාරයෙන් තිරිඟු, කුරක්කන් හා වෙනත් ධාන්‍ය වගී ඇඹිරීම.

ඡායාරූප ශාලාවක් පවත්වා ගෙන යාම.

හිස් ගෝනි ගබඩා කිරීම.

අම්ලකර වායුව පාවිච්චි කරන කම්හලක් පවත්වා ගෙන යාම.

කොප්පරා සෑදීම.

වළක් කැණීමෙන් හුණු ගල් ලබා ගැනීම.

යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් සිඳීම.

සෙක්කුවෙන් පොල්තෙල් සිඳීම.

කොප්පරා ගබඩා කිරීම.

තෙල්වලින් හෝ වෙනත් ඉන්ධනවලින්, වාෂ්පවලින් හෝ විදුලි බලයෙන් ක්‍රියා කරන යන්ත්‍ර පාවිච්චි කරන යම් ව්‍යාපාර යක් පවත්වා ගෙන යාම.

කපු පුළුන් හෝ කොට්ට පුළුන් ගබඩා කිරීම.

අම්ලකර වායුව පාවිච්චි කරන ගරාජයක් පවත්වා ගෙන යාම.

කොහු සෑදීම හෝ ගබඩා කිරීම.

ගෘහ භාණ්ඩ සෑදීම.

භූමිතෙල් ගබඩාවක් තබා ගැනීම.

කපාපු පොල් නිෂ්පාදනය.

පැඟිරි තෙල් හෝ කුරුඳු තෙල් සිඳීම.

ගිනිකූරු සෑදීම.

ලී ඉරන මෝලක් හෝ ස්ථානයක් පවත්වා ගෙන යාම.

අම්ලකර යොදා පැස්සීම.

මිනිරන් සකස් කිරීම හෝ ගබඩා කිරීම.

2. පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

ජාඩි හෝ කරෝල ගබඩා කිරීම.

තොග ගණනේ විකිණීම පිණිස නරක්වන සුළු ආහාර හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.

කෘතිම පොහොර හෝ කොම්පෝස් පොහොර සෑදීම.
විනාකිරි සෑදීම.
සබන් සෑදීම.
හම් පදම් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.
ලේ හෝ අව මස් උනු කිරීම.
හම් ගබඩා කිරීම.
සතුන්ගේ ඇටකටු ගබඩා කිරීම.
ලැලි පොගවා සකස් කිරීම.
කෘතිම පොහොර සෑදීම හෝ කෘතිම පොහොර සාදා ගැනීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි තුනකට වඩා තබා ගැනීම.
රා එකතු කරන ස්ථානයක් තබා ගැනීම.
බීඩි කර්මාන්තය.
සුරුට්ටු කර්මාන්තය.
මීනීපෙට්ටි ගබඩා කිරීම හෝ සෑදීම.
සිමෙන්ති ගබඩා කර තැබීම.
තීන්ත හෝ වාර්නිස් වගී ගබඩා කිරීම.
බෙලෙක් වැඩ පලක් තබා ගැනීම.
දුම්කොළ වියලීම හෝ සකස් කිරීම.
පුවක් වේලා සකස් කිරීම.
රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් සෑදීම.
සෝඩා සෑදීම.
මාළු අයිස් දැමීම.
පැණි හෝ හකුරු සෑදීම.
දර මඩුවක් පවත්වා ගෙන යාම.
දුම්කොළ ගබඩා කිරීම.
උළු හෝ ගඩොල් ගබඩා කිරීම.
පොල් ලෙලි පල් කිරීම සඳහා ලෙලි වලක් පවත්වා ගෙන යාම.
ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වා ගෙන යාම.
ෂීට් රබර් ගබඩා කිරීම.
කොහු හෝ කොහු වලින් හෝ කෙඳි වලින් සෑදූ භාණ්ඩ ගබඩා කිරීම.
වේවැල් බඩු සෑදීම.
තලතෙල් සිඳීම.
සත්ව තෙල් සිඳීම.

3. පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුයි :—

කෙඳි සායම් කිරීම.
ගඩොල් හෝ උළු පිළිස්සීම.
බැටරි පිරවීම.
හුණුගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කැබලි වලට සකස් කිරීම.
අඟුරු සඳහා ලී හෝ පොල්කටු පිළිස්සීම.

9–518—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

එල්. ඕ.—බී. 37/69.

## මාවතගම සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 සහ 156 වැනි වගන්ති යටතේ මාවතගම සුළු නගර සභාව විසින් සම්පාදිතව, ඒ ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අගෝස්තු 27 වැනි දින,
කොළඹ දී ය.

## අතුරු ව්‍යවස්ථා

1. පහත සඳහන් ව්‍යාපාර අනතුරුදායක ව්‍යාපාර ලෙස සැලකිය යුතුය :—

(1) හුණු පිළිස්සීම, ගබඩා කිරීම, පදම්කිරීම හා කැඩීම
(2) භූමිතෙල්, කළුතෙල් හෝ පැට්රල් ගබඩා කිරීම
(3) යකඩ බඩු විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම
(4) රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම
(5) වඩු මඩුවක් තබාගැනීම
(6) දර මඩුවක් පවත්වාගෙන යාම
(7) කොප්පරා සෑදීම හෝ ගබඩා කිරීම
(8) හිස් ගෝනි ගබඩා කිරීම
(9) ලී ගබඩාවක් තබාගැනීම
(10) ලී බඩු නිෂ්පාදනය කිරීම
(11) කෙඳි වර්ග හෝ කෙඳි භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කිරීම
(12) හාල් කොටන හෝ පාගින මෝලක් පවත්වා ගෙන යාම
(13) මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
(14) ඇඹරුම් හලක් පවත්වාගෙන යාම
(15) තෙල් හෝ වෙනත් ඉන්ධන හෝ වාෂ්ප හෝ විදුලි බලයෙන් ක්‍රියා කරවන යන්ත්‍ර පාවිච්චි කරනු ලබන යම්කිසි ව්‍යාපාරයක්
(16) ඡායාරූප ශාලාවක් පවත්වා ගෙන යාම
(17) ස්වර්ණාභරණ නිෂ්පාදනය
(18) කම්මලක් හෝ වාත්තු වැඩපොළක් පවත්වා ගෙන යාම
(19) සිසිල් බීම වර්ග ගබඩා කිරීම
(20) අඟුරු ගබඩා කිරීම
(21) ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වා ගෙන යාම
(22) බයිසිකල් අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
(23) මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ වැඩපොළක් පවත්වාගෙන යෑම

2. පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

(1) මාළු අයිස් දැමීම
(2) ජාඩි හෝ කරවල ගබඩා කිරීම
(3) සුරුට්ටු හෝ බීඩි සෑදීම
(4) මිණීපෙට්ටි සෑදීම හෝ ගබඩා කිරීම
(5) සිමෙන්ති ගබඩා කර තැබීම
(6) දුමකොල ගබඩා කිරීම
(7) පොල් ලෙලි පල් කිරීම සඳහා ලෙලි වළක් පවත්වාගෙන යෑම
(8) ෂීට් රබර් ගබඩා කිරීම.

3. පහත සඳහන් ව්‍යාපාර අනතුරුදායක සහ අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

(1) ගඩොල් හෝ උළු පිළිස්සීම.

9–514—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

එල්.ඩී.—බී. 3/66.

## මුතූර් සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 සහ 156 වැනි වගන්ති යටතේ මුතූර් සුළු නගර සභාව විසින් පනවනු ලැබ, ඒ ආඥාපනතේ 153 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන හා පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අගෝස්තු 27 වැනි දින,
කොළඹ දී ය.

## අතුරු ව්‍යවස්ථා

### ප්‍රසිද්ධ වෙළඳ පොළවල්

1. මුතූර් සුළු නගර සභාව විසින් පිළිගනු ලැබ සම්මත පොදු අතුරු ව්‍යවස්ථාවල XV වන කොටසේ 1 වන අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් ඉටුකිරීමෙහිලා "වෙළඳ ප්‍රදේශය" මුතූර් සුළු නගර සභාවේ පරිපාලන සීමාව තුළවූ ප්‍රදේශය විය යුතුය.

2. සුළු නගර සභාව විසින් පිළිගනු ලැබ සම්මත වූ පොදු අතුරු ව්‍යවස්ථාවල XV වන කොටසේ 4 වන අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් ඉටු කිරීමෙහිලා මුතූර් පොදු වෙළඳසැල් භූමියේ ඉඩ ප්‍රමාණයන් පාවිච්චි කරන හෝ ප්‍රයෝජනයට ගන්නා සෑම තැනැත්තෙකු විසින්ම පහත දැක්වෙන ප්‍රමාණයන් අනුව ගාස්තු ගෙවිය යුතුය :—

| | දිනකට ගාස්තුව රු. ශ. |
|---|---|
| **මාළු වෙළඳ පොළ** | |
| 1. වර්ග යාරයකට වැඩි නොවන සිමෙන්ති දමන ලද එක් එක් බිම් ප්‍රදේශය සඳහා ... | 0 25 |
| 2. වර්ග යාරයකට වැඩි නොවන එක් එක් බිම් ප්‍රදේශය සඳහා ... ... | 0 15 |
| **එළවළු වෙළඳ පොළ** | |
| 3. වර්ග යාරයකට වැඩි නොවන එක් එක් සිමෙන්ති බිම් ප්‍රදේශය සඳහා ... ... | 0 20 |
| 4. වර්ග යාරයකට වැඩි නොවන එක් එක් බිම් ප්‍රදේශය සඳහා ... ... | 0 10 |

**සංචාරක වෙළෙන්දෝ**

3. (1) සභාපති විසින් ඒ සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අවසරය ඇතිව මිස, කිසිම තැනැත්තකු විසින් සංචාරක වෙළෙන්දෙකු වශයෙන් කිසිම එළවළුවක්, පලතුරු වර්ගයක්, මාළු හෝ මස් වර්ගයක් විකිණීමේ ව්‍යාපාරය ආරම්භ කිරීම හෝ කරගෙන යාම නොකළ යුතුය.

(2) සෑම බලපත්‍රයක්ම, එය කලින් අවලංගු කරන ලද්දේ නම් මිස, නිකුත් කරනු ලැබූ අවුරුද්දේ දෙසැම්බර් මස 31 වෙනි දින අවසන් විය යුතුය.

(3) සභාව විසින් නිශ්චය කරනු ලැබූ බලපත්‍ර ගාස්තුවක් සභාපති වෙත ගෙවා ඇති නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවේ 1 වෙනි උපවගන්තිය යටතේ යම් වර්ෂයක් සම්බන්ධයෙන් බලපත්‍රයක් නිකුත් නොකළ යුතු අතර, පොදු වෙළඳ සැලේ යථා පරිදි බලය ලත් මස් හෝ මාළු කඩ බක්කි හිමියන්ට හැර, අන් අයට මස් හෝ මාළු විකිණීම සඳහා සංචාරක බලපත්‍ර නිකුත් නොකළ යුතුය.

(4) පෙරවරු 6 සිට පෙරවරු 11 දක්වා කාලය තුළ, වෙළඳ ප්‍රදේශය තුළ සංචාරක වෙළෙන්දෙකු කිසිම මාළුවක් හෝ මසක් විකිණීමේ ව්‍යාපාරයෙහි යෙදී නොසිටිය යුතුය.

(5) සංචාරක වෙළෙන්දන් පිළිබඳ මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන වලින් කිසිවක් පිළිබඳව යම් කඩකිරීමක් රුපියල් පණහකට නොවැඩි දඩයකින් දඬුවම් කළ හැකි වරදක් විය යුතු අතර දිගටම කරගෙන යනු ලබන කඩකිරීමක් සම්බන්ධයෙන් වූ විට සභාපති හෝ සභාපති විසින් ඒ සඳහා බලය පවරන ලද නිලධාරි යෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසු ඒ කඩකිරීම දිගටම කරගෙන යනු ලබන සෑම දිනයක් සඳහාම රුපියල් විසි පහකට නොවැඩි අතිරේක දඩයකින් ද දඬුවම් කළ හැකි විය යුතුය.

4. මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාපති" යන්නෙන් සුළු නගර සභාවේ සභාපති ද,

"සභාව" යන්නෙන් මුතූර් සුළු නගර සභාව ද,

"පොදු වෙළඳ සැල" යන්නෙන් සුළු නගර සභාව විසින් පිහිටුවා ඇති වෙළඳ සැලද,

අදහස් වේ.

9-511—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

## මාතිපේ සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 සහ 156 (7) දරන වගන්ති යටතේ මාතිපේ සුළු නගර සභාව විසින් සම්පාදිතව රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති තුමා විසින් එකී ආඥාපනතේ 153 වන වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970.8.27 දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

1. දිනපතා පෙරවරු 8 සහ පස්වරු 1 අතර කාලය තුළ කිසිම වාහනයක් මාතිපේ මධ්‍යම වෙළඳ පොළ ඉදිරිපිට මාතිපේ-යාපනය ප්‍රසිද්ධ පාර දිගේ හෝ දැන්වීම් පුවරුවල දක්වා ඇති පරිදි වෙළඳ පොළට යාර 15 ක් උතුරින් සහ දකුණින් එකී ප්‍රසිද්ධ පාර දිගේ හෝ අඹකිරි පාරේ වෙළඳ පොළට දකුණු පසින් හෝ නවතා නො තැබිය යුතුය.

2. (1) වැනි ඡේදයේ විධානවලට අනුකූලව වාහන නැවැත්වීම හෝ නවතා තැබීම තහනම් කොට ඇති ප්‍රදේශයන්හි වාහන පදවන යම් රියැදුරකු විසින් පහත සඳහන් කාර්යයන් සඳහා අවශ්‍ය කාලය සඳහා පමණක් ඒ වාහනය නැවැත්විය යුතුය:—

(අ) එම වාහනයෙන් කෙනෙකු බැසීම හෝ ඊට ගොඩවීම, හෝ

(ආ) එබඳු වාහනයකින් බඩු බෑම හෝ එයට බඩු පැටවීම, හෝ

(ඇ) යම් නිලධාරියකු හෝ බලමණ්ඩලයක් හෝ විසින් ප්‍රදර්ශනය කර ඇති යම් මාර්ග සංඥා හෝ දැන්වීම් පිළිපැදීම, හෝ

(ඈ) එම වේලාවේ ඇති වාහන ගමනා ගමනය යථා පරිදි අනුගමනය කිරීම, හෝ

(ඉ) එම වාහනය නවතා තැබීම සඳහා මාතිපේ සුළු නගර සභාව විසින් නිකුත් කොට ඇති බලයක් හෝ අවසරයක් පිළිපැදීම.

3. මෙම අතුරු ව්‍යවස්ථාවල 1 වන ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කිරීමේ වරද කරනු ලබන කවර අයකු හෝ රුපියල් පනහකට වැඩි නොවන දඩයකට යටත් විය යුතුය.

මෙම අතුරු ව්‍යවස්ථාවල—

"නවතා තැබීම" යනුවෙන් වාහනයක් ඉහත සඳහන් කාර්යයන් සඳහා හැර වෙනත් කවර කාර්යයක් සඳහා අනිශ්චිත කාලයක් නවතා තැබීම අදහස් කෙරේ.

"වාහනය" යන්නෙන් සියලු මොටර් වාහන අදහස් කැරෙන අතර, බයිසිකල්, ට්‍රයිසිකල් සහ ගොන් බැඳි කරත්ත හෝ, මිනිසුන් හෝ බඩු ප්‍රවාහනය කිරීම සඳහා යොදනු ලබන හෝ යෙදිය හැකි යම් කෘතිම උපක්‍රමයක් ඊට ඇතුළත් වේ.

9-509—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

එල්.ජී.—බී. 17/49

## රත්තොට සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129(ආ) සහ 152 වැනි වගන්ති යටතේ රත්තොට සුළු නගර සභාව විසින් පනවනු ලැබ ඒ ආඥාපනතේ 153 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

පී. සිරිවර්ධන,
ස්ථිර ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

1970 අගෝස්තු මස 27 වැනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථාව

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129(ආ) වගන්තිය යටතේ 1970 වර්ෂය සඳහා අය කරනු ලබන ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්දෙන් මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් ස්ථාන නිදහස් විය යුතුය.

### උපලේඛනය

**අංක 1 දරණ ඡන්ද කොට්ඨාශය**

වරිපනම් අංක—වෙළඳ පොල පාර : 22/8.

මාතලේ පාර : 3, 15, 23, 25, 27, 31, 35, 37, 43/1, 49, 57, 59, 71, 85, 95/1.

ත්‍රිකොමලේ පාර : 6, 10, 12, 20, 22, 30, 34.

අංක 2 දරණ ඡන්ද කොට්ඨාශය

නිකලොය පාර : 113, 119, 125, 131, 143, 145, 149, 153, 157, 163, 66, 68, 78, 80, 84, 88, 88A, 90, 90/4, 100, 106, 108, 126, 130.

අංක 3 දරණ ඡන්ද කොට්ඨාශය

නිකලොය පාර : 57/5, 67, 73, 77, 85, 87.

අංක 4 දරණ ඡන්ද කොට්ඨාශය

ගම්මඩුව පාර : 7, 25/1ඒ, 25/3, 25/4, 27/1, 27/5, 27/6, 10.

නිකලොය පාර : 3. 9, 13, 15, 21, 23, 47, 41.

අංක 5 දරණ ඡන්ද කොට්ඨාශය

මාතලේ පාර : 12, 18, 30/4, 30/6, 32/2, 32/3, 36, 40, 44, 46/3, 52, 56, 58, 60, 64, 72, 80/5, 82, 84.

අංක 6 දරණ ඡන්ද කොට්ඨාශය

ගනේතැන්න පාර : 7/12, 13, 23, 23/7, 10.

ලෝන්විල් පාර : 1

මාතලේ පාර : 105, 109, 119, 125, 110, 116, 118, 120, 120ඒ.

9–512—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

ඇල් ඩී.—බී. 19/48

## ගම්සභා ආඥපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 42 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ බිංගිරිය ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පනවනු ලැබ එම වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970.8.27 වැනි දින,
කොළඹ දී ය.

## අතුරු ව්‍යවස්ථාව

1955 ඔක්තෝබර් මස 21 වැනි දින අංක 10,850 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද අප්‍රසන්න හා අන්තරාදායක කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) (ආ) ඡේදයේ අගට පහත සඳහන් කර්මාන්ත එකතු කිරීමෙන් :—

වඩු මඩුවක් පවත්වාගෙන යාම

කොහු මෝලක් පවත්වාගෙන යාම, සහ

(2) (ඇ) ඡේදයේ අගට පහත සඳහන් කර්මාන්තය එකතු කිරීමෙන් :—

අතුරු සඳහා පොල්කටු පිළිස්සීම.

9–516—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

එල්.ඩී.—බී. 21/63

## පුන්ඩලුඔය සුළු නගරසභාව

සුලු නගර සභා ආඥපනත

(256 වැනි අධිකාරය වන) සුලු නගර සභා ආඥපනතේ 129(ආ) සහ 152 වැනි වගන්ති යටතේ පුන්ඩලුඔය සුලු නගර සභාව විසින් සම්පාදිතව, එකී ආඥපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 27 වැනි දින,
කොළඹ දීය.

## අතුරු ව්‍යවස්ථාව

(256 වැනි අධිකාරය වන) සුලු නගර සභා ආඥපනතේ 129(ආ) වැනි වගන්තිය යටතේ පනවනු ලැබුවාවූද, 1970 ජනවාරි මස 23 වැනි දින අංක 14,890 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දවූද, කසළ ශෝධනය පිළිබඳ විශේෂ වරිපනම් බද්දෙන් මිට යාකොට ඇති උපලේඛනයේ විස්තර කරනු ලබන ස්ථාන 1970 වර්ෂය සඳහා නිදහස් කළ යුතුය.

පහත සඳහන් වරිපනම් අංක දරණ ස්ථාන :—

කොට්ඨාශ අංක 1

මහා විද්‍යාලය පාර : 5, 6, 10, 16, 22, 28, 38/15, 46, 54, 56, 58, 60, 62, 64, 64/1, 64/6, 64/7, 64/8, 72, 72/4, 80, 82, 90, 90/1, 90/2, 9 3, 90/5, 90/6, 90/7, 90/8, 90/9, 92, 94, 94/1, 94/2, 98, 100, 100/1, 108, 108/1, 108/2, 116, 118, 120, 122, 132.

කවලන්තැන්න පාර : 111, 111/1, 38, 122.

කොට්ඨාශ අංක 2

මහා විද්‍යාල පාර : 15, 25, 27, 29, 31, 33, 35, 45, 55, 55/1, 65/4, 71, 73, 81, 95, 101, 101/1, 103, 105.

කවලන්තැන්න පාර : 7, 15, 15/1, 15/2, 10, 22, 22/1.

කලවාකැලේ පාර : 9, 25/1, 27, 45, 45/3, 45/6, 45/9, 45/12, 45/15, 45/19, 45/22, 45/25, 45/31, 45/31, 45/34, 45/35, 45/36, 45/37, 45/38, 45/39, 45/41, 10, 10/1, 10/4, 10/5, 10/6, 88/6, 88/11, 88/12, 88/14, 88/17, 88/18, 88/19, 88/20, 88/21, 88/22, 88/23, 88/24, 88/26, 88/27, 88/28, 88/36, 88/41, 88/42, 88/46, 88/50, 88/25.

කොට්ඨාශ අංක 3

මහා විද්‍යාලය පාර : 107, 117, 177/7, 117/8, 117/9, 133, 153, 161, 171, 181, 183.

කලවාකැලේ පාර : 121/4, 121/5, 121/6, 121/9, 121/18, 123, 90/38, 90/46, 90/45, 90/51, 232, 232/11, 232/13, 232/17, 232/20, 232/21, 232/22, 232/32, 232/38, 232/39.

9–510—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

# අය - වැය ලේඛන

## ඇල්පිටිය සුළු නගර සභාව

1970 වර්ෂයේ 1 වන පරිපූරක වැය ලේඛනය

II වන කොටස—විදුලි අංශය

වැය ශීර්ෂය

| | | |
|---|---|---|
| කේ—විදුලි අංශය | | රු. ශ. |
| (3) සේවා හා නිවාස සම්බන්ධතා— | | |
| (ඒ) ද්‍රව්‍ය | ... ... ... | 15,500.00 |
| (බී) කම්කරු කුලී | ... ... | 500.00 |

1970 ජූලි මස 30 වන දින පවත්වන ලද ඇල්පිටිය සුළු නගර සභාවේ මාසික සභා රැස්වීමේ අංක 5(6) දරණ යෝජනා ස්ථිරත්වය අනුව 1970 1 වන පරිපූරක වැය ලේඛනය ඉහත සඳහන් පරිදි සම්මත කර ගන්නා ලදී.

විජිත බන්දු පොන්නම්පෙරුම,
සභාපති,
ඇල්පිටිය සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
ඇල්පිටිය, 70. 8. 20.

අනුමත කරන ලදී.

පර්සි අබේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
ගාල්ල.

පළාත් පාලන කාර්යාලය,
ගාල්ල, 2. 9. 1970.

9–485—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

## රක්වාන සුළු නගර සභාව

**සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40(ii) යටතේ කෙරෙන අයදුම්පත්‍රයි**

1970 වර්ෂයේ අයවැය ලේඛනයේ ඒ ඒ සිරස් යටතේ වෙන් කරන ලද මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂයන්ට මාරුකර අවශ්‍ය වී ඇති අතිරේක වැය සඳහා එම සිරස් යටතේ යෙදවීමට 1970 අගෝස්තු මස 24 වෙනි දින පවත්වන ලද මෙම සුළු නගර සභා රැස්වීමේදී යෝජනා අංක 14 යටතේ සම්මත විය.

| මුදල් ඉතිරි වැය ශීර්ෂ | රු. ශ. | මුදල් අවශ්‍ය වැය ශීර්ෂ | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—(2) ෆක්. කාර්‍යාලීය උපකරණ ... ... | 600 0 | සී.—(4) නඩත්තුව ... ... ... | 600 0 |
| | 600 0 | | 600 0 |

වී. ටී. ජී. කරුණාරත්න,
සභාපති,
රක්වාන සුළු නගර සභාව.

1970 සැප්තැම්බර් මස 2 වැනි දින,
රක්වාන සුළු නගර සභා කාර්‍යාලයේ දිය.

## රක්වාන සුළු නගර සභාව

**පළමුවෙනි අතුරු අයවැය ලේඛනය—සාමාන්‍ය**

| | රු. ශ. |
|---|---|
| ඩී.—(1) (ඊ) බෙහෙත් සහ උපකරණ ... ... | 2,000 0 |
| | 2,000 0 |

වී. ටී. ජී. කරුණාරත්න,
සභාපති,
රක්වාන සුළු නගර සභාව.

1970 සැප්තැම්බර් මස 2 වැනි දින,
රක්වාන සුළු නගර සභා කාර්‍යාලයේ දිය.

9–513—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

## පානදුර නගර සභාව

**1970 අතිරේක අය වැය ලේඛනය—අංක 2**

| වැය ශීර්ෂය | මුදල රු. ශ. | යෝජනා අංකය හා දිනය |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| (2) ආයතන වියදම්— | | |
| (එච්) කරත්ත හා බෝට්ටු තහඩු ගාස්තු ... ... | 200 0 | 1970. 7. 16 දින අංක 5 (17) |
| (ඇන්) වාහන නඩත්තු කිරීම ... ... | 21,730 0 | 1970. 7. 16 දින අංක 5 (24) |
| බී.—මහා මාර්ග :— | | |
| (15) සංඥා පුවරු ... ... ... | 2,000 0 | 1970. 8. 14 දින අංක 5 (15) |
| (16) (ඒ) කරත්ත, ගොනුන් සහ ලොරි නඩත්තු කිරීම ... | 2,500 0 | එම |
| රී.—මහජන සෞඛ්‍යය :— | | |
| (3) වැසිකිළි ශෝධනය— | | |
| (සී) ගබඩා ... ... ... | 2,500 0 | එම |
| (5) ජල සම්පාදනය— | | |
| (සී) නඩත්තු කිරීම ... ... | 50,000 0 | එම |
| එච්.—බල්ලන් ලියා පදිංචි කිරීම :— | | |
| (1) බල්ලන් විනාශ කිරීම ... ... | 1,000 0 | 1970. 7. 16 දින අංක 5 (15) |
| කේ.—ගින්නෙන් ආරක්ෂා කිරීම :— | | |
| (1) ගිනි නිවන උපකරණ ... ... | 915 0 | 1970. 7. 16 දින අංක 5 (18) |
| | 80,845 50 | |

වයිටස් ගුණතිලක,
සභාපති,
පානදුර නගර සභාව.

නගර සභා කාර්යාලය,
පානදුර,
1970 අගෝස්තු මස 21 වැනිද.

9–508/1—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

## පානදුර නගර සභාව

### මුදල් රෙගුලාසි අංක 12 (II) යටතේ කෙරෙන අයදුම්පත—අංක 1

පහත දක්වෙන පරිදි ඒ ඒ වැය ශීර්ෂයන් යටතේ ඉතිරිවේයයි ගණන් බලන ලද මුදල් ඊට අනුරූපව දක්වෙන වෙනත් වැය ශීර්ෂයන් යටතේ වැඩිපුර වියදම් වීමට ඉඩ ඇති මුදල් පියවා ගැනීම සඳහා 1970 වර්ෂයේ අය වැය ලේඛනයේ වෙනස් කිරීම 1970.8.14 වෙනි දින පැවැත්වුන පානදුර නගර සභා රැස්වීමේ දී අංක 5 (15) දරන යෝජනාවෙන් සම්මත කර ගන්නා ලදී.

| මුදල් ඉතිරිවේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂ | මුදල රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම :— | | |
| (1) සේවක වැටුප්— | | |
| (ඒ) 1. ලේකම් ... ... ... | 4,000 | 0 |
| බී.—මහා මාර්ග :— | | |
| (1) වේතන— | | |
| (බී) ඕවර්සියර්වරුන් සහ ලිපිකරුවන් ... ... | 4,000 | 0 |
| ඩී.— නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි :— | | |
| (11) විවාහක නිලධාරීන්ට දීමනා ... ... | 1,500 | 0 |
| ඊ.—මහජන සෞඛ්‍යය :— | | |
| (2) කසළ ශෝධනය— | | |
| (ඒ) වේතන ... ... ... | 8,000 | 0 |
| ඊ.—මහජන සෞඛ්‍යය: — | | |
| (3) වැසිකිළි ශෝධනය— | | |
| (ඒ) වේතන ... ... ... | 6,800 | 0 |
| ඊ.—මහජන සෞඛ්‍යය :— | | |
| (5) ජල සම්පාදනය— | | |
| (ඒ) වේතන ... ... ... | 5,000 | 0 |
| (කේ) නිල ඇඳුම් ... ... ... | 200 | 0 |
| ජේ.—විදුලි බල කාර්‍යාංශය :— | | |
| (3) පුද්ගලික නිවාස වලට දෙන පිරිද්දුම් සහ සේවය— | | |
| (ඒ) උපකරණ ... ... ... | 13,000 | 0 |
| (4) පාලනය සහ සාමාන්‍ය වියදම්— | | |
| (ඒ) වේතනය ... ... ... | 20,000 | 0 |
| (6) දීර්ඝ කිරීම ... ... ... | 10,000 | 0 |
| බී.—මහා මාර්ග :— | | |
| (8) සංවර්ධන කටයුතු ... ... ... | 5,000 | 0 |
| | 77,500 | 0 |

| මුදල් වැඩිපුර වියදම් වේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂ | මුදල රු. | ශ. |
|---|---|---|
| ඊ.—මහජන සෞඛ්‍යය :— | | |
| (6) ආරෝග්‍යශාලා— | | |
| (ඒ) වේතන ... ... ... | 4,000 | 0 |
| (1) සාමාන්‍ය— | | |
| (වයි) විවාහක නිලධාරීන්ට දීමනා ... | 800 | 0 |
| ඇම්.—කියවීම් ශාලා සහ පුස්තකාල :— | | |
| (1) වේතන ... ... ... | 3,200 | 0 |
| ජේ.—විදුලි බල කාර්‍යාංශය :— | | |
| (4) පාලනය සහ සාමාන්‍ය වියදම්— | | |
| (බී) වේතනය (බාහිර කාර්‍ය මණ්ඩලය) ... | 1,500 | 0 |
| ඒ.—සාමාන්‍ය වියදම :— | | |
| (1) සේවක වැටුප්— | | |
| (බී) ලිපිකරුවන් සහ ආදායම් පරීක්ෂක ... | 8,000 | 0 |
| ඒ.—සාමාන්‍ය වියදම :— | | |
| (1) සේවක වැටුප්— | | |
| (ඒ) සභාකාර ලේකම් ... ... | 300 | 0 |
| ඒ.—සාමාන්‍ය වියදම:— | | |
| (1) සේවක වැටුප්— | | |
| (බී) ලිපිකරුවන් සහ ආදායම් පරීක්ෂක ... | 4,000 | 0 |
| බී.—මහා මාර්ග :— | | |
| (1) වේතන— | | |
| (ඒ) කර්මාන්ත අධිකාරී ... ... | 300 | 0 |
| (සී) දීමනා ... ... ... | 400 | 0 |
| (17) විවාහක නිලධාරීන්ට දීමනා ... | 100 | 0 |
| අයි.—කිරුම් හා මිණුම් :— | | |
| (3) වේතන ... ... ... | 200 | 0 |
| ජේ.—විදුලි බල කාර්යාංශය :— | | |
| (4) පාලනය සහ සාමාන්‍ය වියදම්— | | |
| (බී) වේතනය (බාහිර කාර්‍ය මණ්ඩලය) ... | 1,500 | 0 |
| ජී.—සොහොන් භූමි :— | | |
| (1) වේතන ... ... ... | 5,000 | 0 |
| ඊ.—මහජන සෞඛ්‍යය :— | | |
| (1) සාමාන්‍ය— | | |
| (සී) නිල ඇඳුම් ... ... | 200 | 0 |
| ජේ.—විදුලි බල කාර්යාංශය :— | | |
| (4) පාලනය සහ සාමාන්‍ය වියදම් ... | 43,000 | 0 |
| (බී) වේතනය (බාහිර කාර්‍ය මණ්ඩලය) | | |
| ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි :— | | |
| (4) නඩත්තු කිරීම ... ... | 5,000 | 0 |
| | 77,500 | 0 |

වයිටස් ගුණතිලක,
සභාපති,
පානදුර නගර සභාව.

නගර සභා කාර්යාලය,
පානදුර,
1970 අගෝස්තු මස 23 වැනිද.

9–508/2 —70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

## කුලියාපිටිය නගර සභාව

**1970 වර්ෂයේ 2 වන පරිපූරක අයවැය ලේඛනය**

| ශීර්ෂය | රු. | ශ. | දිනය | යෝජනා අංකය |
|---|---|---|---|---|
| ඊ.—මහජන සෞඛ්‍යය :— | | | | |
| (5) ජල සම්පාදනය— | | | | |
| (බී) ගබඩා ... ... ... ... | 14,000 | 0 | ... 1970.8.14 ... | 9 |
| අයි.—කිරුම් හා මිනුම් : | | | | |
| (1) පරීක්ෂකවරුන්ට ගාස්තු ... ... ... | 60 | 0 | ... 1970.8.14 ... | 9 |

ලයනල් ජයතිලක,
කුලියාපිටිය නගර සභාවේ සභාපති.

1970 අගෝස්තු මස 25 වැනි දින,
කුලියාපිටිය නගර සභා කායඹාලයේ දීය.

9–521—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## මැදගම්පත්තු ගම්සභාව—මොණරාගල දිස්ත්‍රික්කය

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත දක්වෙන උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි සඳහන් කර තිබෙන ස්ථානයේ 1970 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍රයක් ඉල්ලා ඉල්ලුම් පතක් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපනතේ 272 වෙනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන මැදගම් පත්තු ගම් සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඈ එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම් ගැසැට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳම |
|---|---|---|---|
| 1. | එම්. අයි. ජෙමිල් මහතා, බකිණිගහවෙල | බකිණිගහවෙල | ගව මස් |
| 2. | එම්. අයි. හසන් මහතා, කොටබෝව | කොටබෝව ... | ගව මස් |

ආර්. ඇම්. ධර්මදාස බණ්ඩා,
මැදගම්පත්තුවේ ගම් සභාවේ සභාපති.

1970 අගෝස්තු මස 4 වැනි දින,
ගම් සභා කායඹාලය, මැදගම.

9–500—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

## පානදුර නගර සභාව

**නගර සභා ආඥාපනත**

(255 වෙනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 162 සහ 164 වෙනි වගන්ති යටතේ පානදුර නගර සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කරනු ලබන බලපත්‍ර වෙනුවෙන්, එහි සඳහන් බලපත්‍ර ගාස්තු 1971 වර්ෂයේ සිට පනවා අය කිරීමට තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ අනුව 1956.1.15 දින හා අංක 10,839 දරණ ගැසට් නිවේදනයෙන් පළ කරන ලද බලපත්‍ර ගාස්තු 1971 වර්ෂයේ සිට අවලංගු වනවා ඇත.

ටයිටස් ගුණතිලක,
සභාපති,
පානදුර නගර සභාව.

1970 අගෝස්තු 29 වැනි දින,
පානදුර, නගර සභා කාර්යාලයේ දීය.

### උපලේඛනය

| වෙළඳ ව්‍යාපාරය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු. | ශ. |
|---|---|---|
| 1. කෘතිම පොහොර නිෂ්පාදනය කිරීම ... | 100 | 0 |
| 2. හම් පදම් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම | 100 | 0 |
| 3. පුවක් වේලා සකස් කිරීම ... ... | 5 | 0 |
| 4. සත්ව ලේ හා මිශ්‍රිත කොටස් උණු කිරීම ... | 250 | 0 |
| 5. මේද නිෂ්පාදනය හෝ උකහා ගැනීම ... | 50 | 0 |
| 6. සබන් නිෂ්පාදනය කිරීම ... ... | 25 | 0 |
| 7. කොහු වර්ණවත් කිරීම ... ... | 5 | 0 |
| 8. කොහු නිෂ්පාදනය හෝ ගබඩා කිරීම ... | 50 | 0 |
| 9. පොල් ලෙලි පල් කිරීමේ වළක් පවත්වා ගෙන යාම | 3 | 0 |
| 10. උම්බලකඩ හොන්ඩර පහකට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීම ... ... | 50 | 0 |
| 11. හුණු, හම්, කෘතිම පොහොර හෝ පොහොර නිෂ්පාදනයට අවශ්‍ය ද්‍රව්‍ය එක් ගෝනියකට වඩා ගබඩා කර තබාගැනීම ... ... | 25 | 0 |
| 12. කොප්පරා නිෂ්පාදනය හෝ ගබඩා කර තබාගැනීම | 25 | 0 |
| 13. යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිෂ්පාදනය කිරීම | 250 | 0 |
| 14. කපාපු පොල් (ඩෙසිකේටඩ්) නිෂ්පාදනය කිරීම ... | 100 | 0 |
| 15. ගඩොල් හෝ උළු නිෂ්පාදනය කිරීම ... | 25 | 0 |
| 16. හුණු පිළිස්සීම හෝ සකස් කිරීම ... ... | 50 | 0 |
| 17. ලී ඉරීමේ වළක් පවත්වාගෙන යාම ... | 10 | 0 |
| 18. මිණිරන් සකස් කිරීම හෝ ගබඩා කොට තබාගැනීම | 50 | 0 |
| 19. දුව ගබඩා කොට තබාගැනීම ... ... | 50 | 0 |
| 20. දරමඩුවක් පවත්වාගෙන යාම .. ... | 5 | 0 |
| 21. මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම (මෝටර් බයිසිකල් හැර) | 50 | 0 |
| 22. මෝටර් වාහන සර්විස් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම (මෝටර් බයිසිකල් හැර) ... | 75 | 0 |
| 23. ෂීට් හෝ ක්‍රේප් රබර් නිෂ්පාදනය හා දුම්ගැසීම | 250 | 0 |
| 24. සෙක්කු මගින් පොල් තෙල් නිෂ්පාදනය කිරීම ... | 15 | 0 |
| 25. තලතෙල් නිෂ්පාදනය කිරීම ... ... | 10 | 0 |
| 26. පුළුන් හෝ පිදුරු ගබඩාකොට තබාගැනීම ... | 5 | 0 |
| 27. ගැලුම් 50 කට වඩා පොල්තෙල් ගබඩාකොට තබාගැනීම ... ... ... | 50 | 0 |
| 28. අත් යන්ත්‍ර මගින් හැර නූල් කැටීම හෝ රෙදි විවීම | 100 | 0 |
| 29. ජලය, වාෂ්ප හෝ වෙනත් යාන්ත්‍රික හෝ විදුලිය බලයෙන් ලී ඉරීම ... ... | 100 | 0 |
| 30 පැතිරි තෙල් ගබඩාකොට තැබීම ... ... | 15 | 0 |
| 31. තිස් ගෝනි ගබඩා කිරීම .. ... | 50 | 0 |
| 32. ලණු හෝ කොහු වලින් තැනූ ද්‍රව්‍ය හොන්ඩර 50 කට වඩා ගබඩාකර තබාගැනීම ... ... | 5 | 0 |
| 33. ලෝහ උණුකර උදුනක් හෝ වාත්තු මඩුවක් (කම්මලක්) පවත්වාගෙන යාම ... | 3 | 0 |
| 34. ගිනිකූරු නිෂ්පාදනය කිරීම ... ... | 100 | 0 |
| 35. කොලපෝර හෝ පෝර මිශ්‍රණ නිෂ්පාදනය කිරීම... | 25 | 0 |
| 36. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම ... ... | 25 | 0 |
| 37. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම— | | |
| (1) වර්ග අඩි 120 දක්වා වූ බිම් ප්‍රමාණයක් ඇති ස්ථානයකින් ... ... | 100 | 0 |
| (2) වර්ග අඩි 120 ට වැඩි වන සෑම වර්ග අඩි 50 හෝ ඉන් කොටසක් සඳහා අමතරව ... | 50 | 0 |
| 38. හුණු මැළු හෝ ජාඩි හොන්ඩර 3 කට වඩා ගබඩාකර තබාගැනීම ... ... | 5 | 0 |
| 39. කරවල හොන්. 3 කට වඩා ගබඩාකර තබාගැනීම ... | 25 | 0 |
| 40. හුණුගල් ගබඩා කිරීම (හුණු පිළිස්සීම හෝ සකස් කිරීම සඳහා වූ ස්ථාන හැර) ... ... | 25 | 0 |
| 41. මාළු වේළීම හෝ ජාඩි දැමීම ... ... | 10 | 0 |
| 42. මාළු ශීත කිරීම (අයිසිං) ... ... | 25 | 0 |

| වෙළඳ ව්‍යාපාරය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු. | ශ. |
|---|---|---|
| 43. මස් වේලීම හෝ සකස් කිරීම ... ... | 10 | 0 |
| 44. ගොම ගබඩා කිරීම ... ... | 5 | 0 |
| 45. යන්ත්‍රානුසාරයෙන් මිරිස් කුඩු කිරීම ... | 25 | 0 |
| 46. බුරුසු නිෂ්පාදනය කිරීම ... ... | 3 | 0 |
| 47. දුම්කොළ මිටි හෝ සිප් පම් 20 කට වඩා ගබඩාකර තබාගැනීම ... ... | 10 | 0 |
| 48. අඟුරු සඳහා දර හෝ පොල් කටු පිළිස්සීම ... | 15 | 0 |
| 49. එළවන් 10 කට වැඩි ගාලක් පවත්වාගෙන යාම ... | 15 | 0 |
| 50. යන්ත්‍රානුසාරයෙන් වී, තිරිඟු, කුරක්කන්, මෑ හෝ වෙනත් ධාන්‍ය කෙටීම ... ... | 25 | 0 |
| 51. ඕනෑම මෑ වර්ගයක් හෝ ධාන්‍ය වර්ගයක් ගෝනි 15 ට වඩා ගබඩා කොට තබාගැනීම ... | 15 | 0 |
| 52. ලී පල් කිරීමේ වලක් පවත්වාගෙන යාම ... | 10 | 0 |
| 53. ගෙත් දගම් දුම්නාසිමෙන් කර්දමුංගු, කුරුඳු හෝ කොහු සකස් කිරීම ... ... | 10 | 0 |
| 54. පශු වෛද්‍යශාලාවක් පවත්වාගෙන යාම ... | 10 | 0 |
| 55. රා එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම ... | 100 | 0 |
| 56. මෝටර් බයිසිකල් හා පාගන බයිසිකල් අළුත්වැඩියා කිරීමේ හා සර්විස් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම ... ... | 5 | 0 |
| 57. බීඩි නිෂ්පාදනය කිරීම ... ... | 10 | 0 |
| 58. සුරුට්ටු නිෂ්පාදනය කිරීම ... ... | 10 | 0 |
| 59. සිගරට් නිෂ්පාදනය කිරීම ... ... | 50 | 0 |
| 60. ඉවත ලන පරණ යකඩ ගබඩාකොට තැබීම ... | 25 | 0 |
| 61. අඟුරු ගබඩාකොට තබාගැනීම ... ... | 5 | 0 |
| 62. බෝට්ටු ඉදිකිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම | 25 | 0 |
| 63. වෙල් ඩින් කිරීමේ ආයතනයක් හෝ ලියවන පට්ටලයක් මගින් වැඩ කරන ආයතනයක් පවත්වාගෙනයාම (මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ හෝ සර්විස් කිරීමේ ආයතන හැර) ... | 25 | 0 |
| 64. විනාකිරි නිෂ්පාදනය කිරීම ... ... | 100 | 0 |
| 65. සරුවත් කඩයක් පවත්වාගෙන යාම ... | 5 | 0 |
| 66. ටයර් හා ටියුබ් වල් කනයිසින් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම (මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ හෝ සර්විස් කිරීමේ ආයතන හැර) ... | 5 | 0 |
| 67. පැණි ගැලුම් 50 කට වඩා ගබඩාකොට තබාගැනීම ... | 15 | 0 |
| 68. ලිනන් වර්ණ දැමීම ... ... | 5 | 0 |
| 69. ගඩොල්, උළු හෝ කඩාපු ගල් ගබඩා කිරීම ... | 25 | 0 |
| 70. යන්ත්‍රානුසාරයෙන් කෙරෙන කුඹල් කර්මාන්තය | 250 | 0 |
| 71. ඉවත ලන පොල් හෝ මණ්ඩිවලින් දුන්නක්කු සෑදීම ඇතුළුව පොල් තෙල් නිෂ්පාදනය (යන්ත්‍ර හෝ සෙක්කු මගින් හැර) ... | 10 | 0 |
| 72. විනාකිරි ගැලුම් 50 කට වඩා ගබඩාකොට තබාගැනීම (විනාකිරි නිෂ්පාදනය කිරීම හැර) ... | 50 | 0 |
| 73. බේකරියක් පවත්වාගෙන යාම ... | 50 | 0 |
| 74. බොජුන් හලක් (ඊටින් හවුස්) පවත්වාගෙන යාම | 15 | 0 |
| 75. තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම ... | 15 | 0 |
| 76. රෙස්ටෝරන්ට් එකක් පවත්වාගෙන යාම ... | 50 | 0 |
| 77. හෝටලයක් පවත්වාගෙන යාම ... ... | 100 | 0 |
| 78. මස් කඩයක් පවත්වාගෙන යාම ... ... | 250 | 0 |
| 79. මසුන් වෙළඳපොලක් පවත්වාගෙන යාම (බලපත්‍ර ලබා ඇති පොදු හෝ පෞද්ගලික වෙළඳ පොලකින් පිටත)— | | |
| (අ) මසුන් තොග වශයෙන් විකිණීම ... | 250 | 0 |
| (ආ) මසුන් ශීත කළ මාළු, මස් සහ කුකුල් මස් සිල්ලරට විකිණීම ... ... | 50 | 0 |
| 80. ගවගාලක් පවත්වාගෙන යාම ... | 50 | 0 |
| 81. කිරි වෙළඳාම පිණිස කිරි පට්ටියක් පවත්වාගෙන යාම— | | |
| (අ) දෙනුන් 3 කට වැඩි නොවන ... | 10 | 0 |
| (ආ) දෙනුන් 3 කට වැඩි, එහෙත් 10 වැඩි නොවන ... ... | 15 | 0 |
| (ඇ) දෙනුන් 10 කට වැඩි ... | 30 | 0 |
| 82. පොදු නවාතැන් පොලක් පවත්වාගෙන යාම ... | 25 | 0 |
| 83. සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 200 | 0 |
| 84. කොණ්ඩා සකස් කිරීමේ ආයතනයක් හෝ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම ... | 10 | 0 |
| 85. සිනමා ශාලාවක් පවත්වාගෙන යාම ... | 250 | 0 |
| 86. ගෘහභාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හා විකිණීමේ ආයතනයක් පවත්වාගෙන යාම ... | 50 | 0 |
| 87. ගෘහභාණ්ඩ වෙළඳ ආයතනයක් පවත්වාගෙන යාම | 15 | 0 |
| 88. යකඩ බඩු (හාඩ්වෙයාර්) වෙළඳ පොලක් පවත්වාගෙන යාම ... ... . ... | 50 | 0 |
| 89. රෙදි පිළි වෙළඳ සැලක් පවත්වාගෙන යාම ... | 50 | 0 |
| 90. මෝටර් රථ අමතර කොටස් වෙළඳ ආයතනයක් පවත්වාගෙන යාම ... ... | 50 | 0 |
| 91. විදුලි උපකරණ වෙළඳ ආයතනයක් පවත්වාගෙන යාම ... ... ... | 50 | 0 |
| 92. සුවඳ විලවුන් වෙළඳ ආයතනයක් පවත්වාගෙන යාම | 50 | 0 |
| 93. ලෝන්ඩරියක් පවත්වාගෙන යාම ... | 25 | 0 |
| 94. බටහිර ඖෂධ වෙළඳ සැලක් (ෆාමසියක්) පවත්වාගෙන යාම ... ... ... | 50 | 0 |
| 95. අයිස්ක්‍රීම් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 50 | 0 |
| 96. බස් හෝ ලොරි බොඩි ඉදිකිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම ... ... | 100 | 0 |

9–501—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

## මැද පලාත ගම්සභාව—හලාවත දිස්ත්‍රික්කය

### ගොසාතක ආඥපනත

මෙහි දක්වෙන උපලේඛනයෙහි නම් සඳහන් අය එහි සඳහන් කර ඇති ස්ථානයන්හි මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා 1970 වර්ෂය වෙනුවෙන් බලපත්‍ර ඉල්ලුම් කර සිටින බවත් ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන මැදපළාත ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත දන්වා එවිය යුතු බවත් ගොසාතක ආඥපනතේ (272 වැනි පරිච්ඡේදයේ) 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. ඒ. ඇල්. ඇම්. හනිපා, වලහපිටිය පාර, නාත්තන්ඩිය | නාත්තන්ඩියේ පදිංචි ඒ. ඇම්. තාගීර් මහතාට අයිති ඉහළ කොට්ටරාමුල්ල පිහිටි "කැටකාලගහවත්ත" නමැති ඉඩමේ පිහිටි මස් කඩය. | හරක් මස් සහ එළු මස් |

ඒරන් අභයකෝන්,
සභාපති,
මැදපළාත ගම්සභාව.

මැදපළාත ගම්සභා කාර්යාලය,
තබ්බෝව, නාත්තන්ඩිය,
1970.9.1 වැනි දින,

9–486—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

## කඳාන සුළු නගර සභාව

### 1971 වර්ෂය සඳහා වූ ඒකාබද්ධ වරිපනම් බද්ද

සුළු නගර සභා ආඥා පනත (256 වැනි අධිකාරිය) යටතේ ගතවී යන 1970 වර්ෂයට බලපැවැත්වූ පහත සඳහන් ඒකාබද්ධ වරිපනම් බදු 1971 වර්ෂයට ද, සුළු නගර සභා සීමාව තුළ එලෙසම පැනවීමට කඳාන සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම නගර සභා සීමාව තුළ තිබෙන කුඹුරු හැර සියලුම නිශ්චල දේපොල වල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වූ ඒකාබද්ධ වරිපනම් බදු පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හිදී අවසන් වන අයුරු ත්‍රෛමාසික වශයෙන් ගෙවිය හැකි වේ.

ජේරාඩ් බී. හල්පෙ,
සභාපති,
කඳාන සුළු නගර සභාව.

1970 සැප්තැම්බර් මස 1 දින,
කඳාන සුළු නගර සභා කාර්යාලයේ දීය.

9–494/1—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

## කඳාන සුළු නගර සභාව

### 1970 වර්ෂයේ වරිපනම් ලේඛනය

1970 වර්ෂය සඳහා කඳාන සුළු නගර සභාවේ වරිපනම් ලේඛන සූදානම් බවත්, කාර්යාලීය වේලාවන් තුළදී ඒවා පරීක්ෂා කළ හැකි බවත් නගර සභා ආඥා පනතේ (252 අධිකාරියේ) 235 (1) කාණ්ඩය. හා සම්බන්ධ වූ සුළු නගර සභා ආඥා පනතේ (256 අධිකාරියේ) 165 දරණ කාණ්ඩය යටතේ මෙයින් දන්වා සිටිමි.

ජේරාඩ් බී. හල්පෙ,
සභාපති,
කඳාන සුළු නගර සභාව.

1970 සැප්තැම්බර් මස 1 දින,
කඳාන සුළු නගර සභා කාර්යාලයේ දීය.

9–494/2—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

## මාතර නගරය

### ජලභීතිකා රෝගය

මාතර නගර සභා සීමාව තුල පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක ගෙමිදුලක හෝ උයනවත්තක නොවන්නාවූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඩාවතේ යන, නැතහොත් බැඳ නොතබන ලද්දා වූ හෝ දක්කා ගෙන නොයනු ලබන්නා වූ කිසියම් සුනඛයකු (බල්ලෙකු හෝ බැල්ලියකු) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවේලෙහිම විනාශ කරනු ලබන බව (ලංකාවේ ව්‍යවස්ථා ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වන පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥාපනතේ II වන වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශය ගැසට් පත්‍රයේ පලවන දින සිට ඉදිරි මාස හයක කාලයකට වලංගු වේ.

ඇස්. කේ. මැදස,
සභාපති,
මාතර නගර සභාව.

1970 සැප්තැම්බර් මස 3 වැනි දින,
මාතර නගර සභා කාර්යාලයේ දීය.

9–490—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන

### (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත)

1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය යටතේ බේරුවල නගර සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පල කර සිටිනු ලැබේ.

#### යෝජනාව

පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1954 මාර්තු 26 වැනි දින අංක 10,657 දරණ ගැසට් පත්‍රයේ පල කරන ලද්දාවූද උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල (xvii) යන කාණ්ඩය මෙම අතුරු යෝජනාව ගැසට් පත්‍රයේ පළ වළ වන දින සිට සම්මත කරගැනීමට බේරුවල නගර සභාව විසින් 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වැනි වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඇම්. ඒ. බාකීර් මාකාර්.
සභාපති,
බේරුවල නගර සභාව.

1970 අගෝස්තු මස 28 දින,
බේරුවල නගර සභා කාර්යාලයේ දීය.

9–503—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම යැවිය යුතුයි.

### උපලේඛනය

### 1970

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.10 සිකුරාද | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සි[illegible] | [illegible]හවල් | 12.0 |
| අගෝස්තු | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3 30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.